# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWS LETTER

❖ සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❖ 2008 අගෝස්තු ❖ මෙත් සවිය හයවන කාණ්ඩය ❖ එකොලොස්වන කලාපය




සොමාවති චෛත්‍ය රාජයානන් වහන්සේ


ඉංගිරිය මඩකඩ ආරණ්‍යය සේනාසනයේදී


මස් මඩුවේදී අභය දානය ඉල්ලා වැඳවැටීම.


'අපවත්වී වදාල මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහනාහිමි.

නිතින් මෙත් සිතින් මහී වෙසෙම් වා!
ගතින් මෙන් සිතින් රෝ මුදම් වා!
බැතින් තුන් රුවන් ඔජ නගම් වා!
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා!

ශ්‍රී විජයාරාමය, ... පාර, කොළඹ - 06
දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අ... ...methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

# මෙත්සවිය වැඩසටහන් පෙළගැස්ම





තම ශ්‍රමය, ධනය, කාලය කැපකොට මෙත්සවිය පවත්වාගෙන යාමට උරදෙන කමිටු නිලධාරීනට මහ සභාවේදී තුති සහතික ප්‍රධානය

සගරාවේ 10 වන කලාපයේ ප්‍රථම පිටපත ගරු සභාපතිතුමාට පිළිගැන්වීම.





12 වන භාවනා වැඩසටහනේදී, සක්මන් භාවනාව, කසින භාවනාව සහ කමටහන් ලබාදීම.





සෑම මසකම පළමුවන ඉරුදින ධර්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේදී පැවත්වූ වැඩසටහන් කිහිපයක්. ගිහිදේශනාව අරිසෙන් අහුබුදු ශූරීන්, පූජ්‍යපාද කොටුගොඩ ධම්මාවාස අනුනාහිමි, පූජ්‍යපාද කඳුබොඩ සමථ-විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ කම්මට්ඨානාචාර්ය විමල හිමි





යෝගී අභ්‍යාස පිලිබඳ දේශනය චාමින් වර්ණකුල මහතා ඇතුළු කණ්ඩායම. ....





සෑම වසරකම පවත්වන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත්වීමේ නවීන ක්‍රම වේද පිළිබඳව වැඩමුළුව 2008.04.06 බොරැල්ල තරුණ බෞද්ධ සංගම් ශාලාවේදී පැවැත්වුණි.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06

දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org


## අප ගැන වචනයක්.....

මෙත් සවිය සංසදය නිරවුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයන්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයන් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමගින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයන්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාල වලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයන්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දන-සීල-භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන තිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් මාංශ භක්ෂනයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### මීළඟ දාන සීල භාවනා වැඩ සටහන

මීළඟ දාන-සීල භාවනා වැඩසටහන 2008.09.07 දින හිට්ටඹුව වාරණ ශාන්ත තපෝවන අසපුවේදී පැවැත්වේ. මේ පිළිබඳ වැඩි විස්තර හතරවන පිටුවේ දක්වා තිබේ.

### 2008.10.05 ඉරුදින මාසික රැස්වීම

සෑම මසකම පළමුවැනි ඉරුදින සිරිත් පරිදි අනිවාර්යයෙන්ම (දාන-සීල-භාවනා වැඩසටහන් සඳහා සදහම් චාරිකාවේ නොයෙදෙන දින වලදී) මාසික රැස්වීම සහ විශේෂ දේශනය කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධම්ම ගවේශී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වේ. එහෙයින් දැන්වීමක් ලැබුනද නොලැබුනද, සෑම මසකම පළමුවන ඉරුදින (සදහම් චාරිකාවල නොයෙදෙන දින වලදී) ඉහත මාසික රැස්වීම් වැඩසටහන් සඳහා ප.ව. 2-4 අතර කාලය තුළ පැමිණෙන ලෙස සියලු සාමාජිකයින්ගෙන් මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු. ඉදිරි වැඩසටහන් පිළිබඳ තොරතුරු (www.methsaviya.org) වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

අපගේ මීළඟ ප්‍රථම ඉරුදින මාසික වැඩසටහන 2008.10.05 දින පූජ්‍යපාද කොටපොල අමරකිත්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්ම දේශනාවක් ද සහිතව පැවැත්වීමට නියමිතය. පස්වරු 2.00 ට පෙර පැමිණ අසුන් ගන්න.

### 14 වන භාවනා වැඩ සටහන 2008.08.31 දින ආරම්භවේ

මෙම 14 වන වැඩසටහන සඳහා අයදුම්පත් බාර ගැනීම අවසන්කර ඇත. 2009 ජනවාරි සිට පටන්ගන්නා 15 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන සඳහා නව සාමාජිකයන් බඳවා ගැනීමට සාමාජික අයදුම්පත් බාර ගැනීම සිදුකෙරේ. අයදුම්පත් සඟරාවේ ඇතුල් පිටුවෙන් හෝ මෙත් සවිය වෙබ් අඩවියෙන් (www.methsaviya.org) ලබා ගත හැක. කල්වේලා ඇතිව අයදුම්පත් එවීමෙන් තෝරාගැනීම සඳහා වන අපහසුතාවයන් මගහරවා ගත හැකි වනු ඇත.

### මිරිසවැටිය චෛත්‍ය රාජයාණන් වහන්සේගේ සලපතල මලුව ප්‍රතිසංස්කරණ වැඩ අධීක්‍ෂණය කිරීම

ඉදිරියේදී සැලසුම් කිරීමට බලාපොරොත්තු වන මෙම චාරිකාවට මිරිසවැටිය චෛත්‍ය සලපතල මළුවේ ගල් ඇතිරීම සඳහා මුදල් දුන් සියලු පින්වතුන්ට හා ඔවුන්ගේ පවුල්වල අයටත් මීට අමතරව මෙත්සවිය ඕනෑම සාමාජිකයෙකුට හා ඔවුන්ගේ පවුල්වල අයටත් සහභාගී විය හැක.

### අසරණ සරණ සහ මරණයට කැප වූ සතුන් නිදහස් කිරීම සඳහා පිංකැටවල එකතු කළ මුදල්

සතුන් නිදහස් කිරීම සඳහා පිං කැටවල එකතු කළ මුදල් භාරදීමට කැමති අය මෙත්සවිය කාර්යාලයට එම මුදල් භාරදී පිං පත්‍රිකාවක් ලබා ගන්න.

### මීළඟ මෙත්සවිය සඟරාවේ පල කිරීම සඳහා සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පල කරනු ලබන දැන්වීම් භාර ගැනීම.

මීලඟ මෙත්සවිය සඟරාවේ පල කිරීම සඳහා ලබාදෙන සාමාජිකයින්ගේ ලිපි සහ නොමිලයේ පල කරනු ලබන දැන්වීම් 2008.10.30 දිනට පෙර සංස්කාරක මහතා වෙත හෝ කාර්යාලයට භාර දෙන්න.

### 2009 වසර සඳහා නොමිළයේ බෙදාහරිනු ලබන මෙත්සවිය කැලැන්ඩරය

2009 වසර මෙත්සවිය කැලැන්ඩරය 2008 12 07 වන දින කොළඹ ධර්ම ගවේශී බෞධාශ්‍රමයේදී පැවැත්වෙන ප්‍රථම ඉරුදින මාසික රැස්වීමේදී සහ ඉන්පසු කාර්යාලයෙන්ද ලබාගත හැකියි.


### මෙත් සවිය - විධායක කමිටුව 2008

**ගරු අනුශාසකවරු**
ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අතිපූජ්‍ය
අහංගම ආනන්ද මහා සථිවිරයන්
වහන්සේ

**අතිපූජ්‍ය**
මඩවල උපාලි මහා සථිවිරයන්
වහන්සේ

**ගරු සභාපති**
විශ්වවිද්‍යා අධිමනෝවිද්‍යාවේදී
ශාසන දීපන, විද්‍යාකීර්ති
ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
සරත් ඉලංගන්තිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දොඹගොඩ මහතා
චමින්ද බලවෙදගේ මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
ජනක සුවඳරත්න මහතා

**සංස්කාරක**
සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

**පරිගණක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**
චමිල ප්‍රසන්න මහතා


**ගරු කාරක සභිකවරු**

නාලක එදිරිසිංහ මහතා
පී. සූරියආරච්චි මහතා
සුසන්ත යාපා මහතා
රංජිත් සොයිසා මහතා
රොෂාන් ඉන්දු මහතා
බංදු අබේරත්න මහතා

# මීලඟ දාන-සීල-භාවනා වැඩ සටහන සහ සඳහම් චාරිකාව

මීලඟ දාන සීල භාවනා වැඩසටහන වාරණ ශාන්ත තපෝවනයදී පැවැත්වේ. අගෝස්තු 8 වන දිනට යොදා ගෙන තිබූ මුත් සාක් සමුළුව එම දිනවල කොළඹදී පැවැත්වුනු බැවින් අපහසුතා මඟහැරවීම පිණිස 2008.09.07 ඉරුදින පැවැත්වීමට කටයුතු යොදා ඇත. නිට්ටඹුව නගරය ආසන්නයේ ඉතා සුන්දර ප්‍රදේශයක මෙම අසපුව පිහිටා ඇත. භාවනායෝගී භික්ෂූන් වහන්සේලා දසනමක් පමණ මෙහි වැඩ සිටී.

මෙදින සුපුරුදු පරිදි මෙත්සවිය පිහිටා ඇති වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් බස්රථ කීපයක් පෙ.ව. 7.00 පිටත් වන අතර පෙ.ව. 7.15ට, කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයෙන් බස්රථ කීපයක්ද පිටත් වේ. මෙදින සඳහම් චාරිකාව සඳහා සහභාගිවන අප සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා මෙම බස්රථ වෙන් කර ඇත. ආසන වෙන් කිරීම සඳහා සහ මගදී රථවලට නැගීමට බලාපොරොත්තුවන අය සංසදයේ සමලේකම් බී. ඩබ්. චමින්ද මහතා අමතන්න. (දු. ක. 0777390906 ) සාමාජිකයින්ගේ පවුල්වල සාමාජික නොවන අයටද මේ සඳහා සහභාගි විය හැකි මුත් එදින පැමිණෙන සියලුදෙනා සිල්සමාදන් වීමට සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතුය.




මෙදින මුළු දිනයම පලතුරු හා ගිලන්පස හැර වෙනත් අහරක් අප විසින් ගනු නොලැබේ. එබැවින් දානය සපුරා ගැනිම පිණිස පලතුරු වෙනත් අයකුටද සෑහෙනසේ රැගෙන එන්නේ නම් මැනවි.

පානය සඳහා කුඩා වතුර බෝතලයක් රැගෙන එන්නේනම් වඩාත් සුදුසුය. මදුරුවන්ගෙන් ප්‍රවේශම් වීම පිණිස පැඟිරිතෙල් හා ආලේපන වැනි දේත් රැගෙන ආ හැකිය. ඉඳගෙන භාවනා කිරීම සඳහා පත්කඩයක්, කුෂන් එකක් හෝ කුඩා කොට්ටයක් වැනි යමක් රැගෙන ඒම මැනවි

බස්රථ සඳහා වන ප්‍රවාහන ගාස්තු පියවීමට බරපැන රු. 300/- ක් වන අතර මෙත් සවිය සාමාජික නොවන පවුලේ අය සඳහා රු. 350/- වේ. බරපැන හෝ අත්තිකාරම් මුදල් 2008.08.31 පෙර කාර්යාලයට ගෙවා ආසන වෙන්කරවා ගත යුතුය.

එදින වැඩසටහන අවසානයේදී සවස්වරුවේ ආරණ්‍යාධිපති භාවනා කම්මට්ඨානාචාර්ය සුල්තානාගොඩ සුදස්සන හිමියන් විසින් ධර්ම දේශනාවක් හා ධර්ම සාකච්චාවක් පවත්වනු ලැබේ. මෙම පූජා භූමියේ ඉදිවන සීමාමාලකය සහ ධර්මශාලාව සඳහා මූල්‍යමය උපකාරයක් කිරීම වඩාත් ප්‍රයෝජනවත් බැවින් ඒ සඳහා සංසදයේ සාමාජික වන සහ නොවන අයටද එදිනම දායක විය හැක.

මීට අමතරව මෙහි භාවනාවේ යෙදෙන ස්වාමීන් වහන්සේලා සඳහා පිරිකර පූජා කිරීමට කැමති පිංවතුන් හට ඒ සඳහා කැමති දෙයක් පූජා කළ හැක. භාවනා මධ්‍යස්ථාන සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන මදුරු දැගර, රෙදි පාපිසි, දාන ශාලාවට අවශ්‍ය පිගන්, කෝප්ප හා ලොකු ඇලුමිනියම් වළං ආදිය දානය බෙදීම සඳහා ප්ලාස්ටික් බේසම්, ප්ලාස්ටික් බාල්දි, හැඳි මෙන්ම මුද්දර හා කවර, A4 කඩදාසි කොළ, ඉටිපන්දම්, ටෝච් සහ බැටරි, සීනි, රතුහාල් සහ පරිප්පු වැනි වියලි ආහාර වර්ග ඇද ඇතිරිලි ආදිය, පූජා කල හැක. (විජයාරාමයට ආපසු පැමිණීම ප.ව. 5.00 සිදුකිරීමට බලාපොරොත්තු වන අතර ගමන සඳහා බස්රථ පැමිණෙනුයේ කඩුවෙල සිටය.)

## මෙත් සිතින් කරන දැනුම් දීමක්

ඉදිරි කාලයේදී මෙත් සවිය මගින් පවත්වනු ලබන දාන-සීල-භාවනා සහ වෙනත් පුණ්‍ය කටයුතු වලදී ඒවාට සහභාගි වන්නා වූ සාමාජික සාමාජිකාවන් කිසිම හේතුවක් නිසා හෝ බිම එලා ඉඳගැන්මට සහ තමන්ගේ බඩු බාහිර ආදිය ගෙන යාමට, පොලිතින් උර හෝ පොලිතින් කොල භාවිතා නොකළ යුතු වන්නේය. මේවායින් නැගෙන හඬ නිසා භාවනාවට බාධා ඇතිවී තිබේ. පසු ගිය කාල වලදී සිදුවූ යම් යම් අපහසුතාවයන් මෙන්ම නොයෙක් දෙනාගේ ඉල්ලීම ද සැලකිල්ලට ගෙන මෙම පියවර ගැනීමට සිදු වී ඇති බැව් දැනුම් දෙන්නෙමු.

# සිවු බුදුවරු

බුද්ධ ශබ්දය පටිසම්භිදාමග්ගපාළියෙහි හා මහානිද්දේසපාළියෙහි ද පසළොස් ආකාරයකට විග්‍රහ කොට ඇත. අර්ථනිරූපණය කොට ඇත. එයින් ප්‍රධානතම විග්‍රහය නම් "බුජ්ඣිතා සච්චානීති බුද්ධෝ, බොධෙතා පජායාති බුද්ධො - චතුරාර්‍ය සත්‍යයන් අවබෝධ කෙළේ බුද්ධ නම්, අන්‍යයනට අවබෝධ කැරැවූයේ බුද්ධ නම්. ඒ බුදුවරු සම්මාසම්බුද්ධ - පච්චෙකසම්බුද්ධ - චතුසච්චබුද්ධ - සුතබුද්ධ යි කොටස් සතරකට බෙදෙති.

1. සම්මා සම්බුද්ධ - නියත විවරණයෙහි පටන් අසංඛ්‍ය හතරකුත් කල්ප ලක්‍ෂයක් බුද්ධකාරක ධර්‍මයන් පුරමින් සුවිසි බුදු කෙනකුන් හමු වැ වැඳ පුදා විවරණ ලබා ගෙන දහම් අසා දහම් මඟ පුරුදු පුහුණු කොට අන්තිම ජාතියෙහි දී රජසැප අත්හැරැ පැවිදි වැ සමාජය පිළිගෙන තිබුණු මෝක්‍ෂ මාර්ගය වන දුෂ්කරචත් සමාදන් වැ පුරා එය නිවන් මග නොවන බව දැන වදාරා පූර්‍ව බුදුවරුන් සමයෙහි පුරුදු පුහුණු කොට භවයෙන් යටපත් වී තිබුණු නිවන්මග පාදා ගෙන එහි ගමන් කොට සව් කෙලෙසුන් නසා අන්‍යයනට ද අවබෝධ කැරැවිය හැකි ශක්තිය ඇති වැ පරෝපදේශ රහිත වැ තමන් ම චතුරාර්‍ය සත්‍යයන් අවබෝධ කැරැගත් ගෞතම බුදුරජාණන් වහන්සේ වැනි උතුමෝය.

2. පච්චෙකසම්බුද්ධ - අසංඛ්‍ය දෙකකුත් කල්ප ලක්‍ෂයක් බුද්ධකාරක ධර්‍මයන් පුරමින් සසරැ සැරිසරා අවුත් සම්මාසම්බුදුරජාණන් වහන්සේ කෙනකුන්ගේ ශාසනය නොපවත්නා කාලයෙක් හි අන්තිම භවෝත්පත්තිය ලබා පැවිදි වැ නිවන් මග ගමන් කොට අන්‍යයන්ට අවබෝධ කැරැවිය හැකි ශක්තිය නැති වැ පරෝපදේශ රහිත වැ තමන් ම චතුරාර්‍ය සත්‍යයන් අවබෝධ කැරැගෙන උපදේශ රහිත වැ ආදර්‍ශයෙන් පමණක් අන්‍යයනට යහමග පෙන්වන උතුමෝය.

3. චතුසච්චබුද්ධ - නියත විවරණයෙහි පටන් අග්‍ර ශ්‍රාවකයන් නම් අසංඛ්‍ය එකකුත් කල්ප ලක්‍ෂයක්, සාමාන්‍ය ශ්‍රාවකයන් නම් කල්ප ලක්‍ෂයක් බුද්ධකාරක ධර්‍මයන් පුරමින් සසරැ සැරිසරා අවුත් බුද්ධෝත්පාදයෙහි උපත ලබා උද්ඝටිතඥවැ හා විපච්චිතඥවැ ද බණ අසා නිවන් අවබෝධ කැරැ ගත් හා බණ අසා මාර්ගය වඩා නෙය්‍ය හා පදපරම වැ නිවන අවබෝධ කැරැ ගත් උතුමෝ ය.

4. සුතබුද්ධ - අනාදිමත් කාලයක් මුළුල්ලේ සසරැ සැරිසරමින් බුද්ධෝත්පාද කාලයන්හි ද ඉපිදැ බුදුවරුන් දැක වැඳ පුදා බණ අසා පදපරම වැ නිවන් මඟ ගමන් කෙරෙමින් ද සිට ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් මිනිස් උපත ලබා බෞද්ධ වැ ධර්‍මය ඉගෙන ව්‍යක්ත වැ විනීත වැ විශාරද වැ බහුශ්‍රැත වැ ධර්‍මධර වැ ධර්‍මානුධර්‍මප්‍රතිපන්න වැ තමනුත් නිවන්මඟ යමින් ආදර්‍ශයෙන් හා උපදේශයෙන් ද අනුනුත් නිවන්මඟ යවන උතුමෝ ය.

මඩිහේ පඤ්ඤාසීහ මහනාහිමියන්ගේ කෘතියක් ඇසුරෙණි

# මහින්දාගමනය සහ බෝධි පූජාවේ ආරම්භය

වසර දෙදහස් පන්සියකට අධික අඛණ්ඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ පරිවර්තනය සිදුවූ සංසිද්ධිය ලෙස හැඳින්විය හැක්කේ බුද්ධ වර්ෂ 236 දී පොසොන් පොහෝ දිනය හා සම්බන්ධවන මහින්දාගමනයයි. ධර්මදූතයන් වහන්සේලා නමක් වශයෙන් ලක්දිවට වැඩමකළ මිහිඳු මහ රහතන් වහන්සේ බුදු දහම ප්‍රචාරය කිරීම පමණක් නොව අප රටෙහි භාෂාව සාහිත්‍යය, කලා ශිල්ප සිරිත් විරිත් ආදී ජන ජීවිතයේ සෑම අංගයක්ම පෝෂණය කිරීමට අදාළ පසුබිම සකස් කිරීමේ නියමුවාණන් බවට පත්වූහ. මිහිඳු හිමියන් විසින් ලක්දිවට හඳුන්වා දුන් බුදුදහම ප්‍රාථමික ඇදහීම් වලින් යුත් සමාජයකට ඉදිරිපත් කළ නව දර්ශනයක් පමණක් නොව ජීවන මාර්ගයකි.

මෙම නව දර්ශනය ශ්‍රී ලංකිකයන් වැලඳගත්තේ අන්ධ භක්තියෙන් නොවේ. මිහිඳු මාහිමියන් වැඩමවන විට මෙරට සංවිධානාත්ම දියුණු ආගමක් නොපැවතුන ද යම් දෙයක් විමසීමෙන් යුතුව පිළිගැනීමට තරම් බුද්ධිමත් ජනකොටසක් ජීවත්වූ බව පිළිගත හැකිය. ඒ බව වඩාත් තහවුරු වන්නේ මිහිඳු මාහිමියන් දම් දෙසීමට පෙර දේවානම්පිය තිස්ස රජතුමා විමර්ෂණයට ලක්කළ සංවාදය තුළින් ය. එහිදී රජතුමා විසින් ලබාදුන් පිළිතුරුවලින් පැහැදිලි වන්නේ ගැඹුරු ලෙස සිතාමතා යමක් පිළිගැනීමට හෝ බැහැර කිරීමට අවශ්‍යවන බුද්ධිමත්භාවය එතුමා තුළ පැවති බවය. එපමණක් නොව මිහිඳු මාහිමියන් විසින් රජතුමා විසින් ලබාදුන් පිළිතුරුවලින් පැහැදිලි වන්නේ ගැඹුරු ලෙස සිතාමතා යමක් පිළිගැනීමට හෝ බැහැර කිරීමට අවශ්‍යවන බුද්ධිමත්භාවය එතුමා තුළ පැවති බවය. එපමණක් නොව මිහිඳු මාහිමියන් විසින් රජතුමා ඇතුලු පිරිසට ප්‍රථමයෙන්ම දේශනා කළ චූල්ලහත්ථිපදොපම සූත්‍රයෙහි තේමාව වන්නේ ද සිතීමේ හා විමසීමේ ශක්තිය තම යථාර්ථය අවබෝධ කර ගැනීමේ ක්‍රමවේදයයි.

ඒ අනුව රජතුමා ඇතුළු පිරිස බුදු දහම පිළිගැනීමත් සමඟ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයත් රජතුමා අනුගමනය කළ ජනතාවත් නව මගකට, නව සංස්කෘතියකට, නව ජීවන රටාවකට යොමු විය. මිහිඳු මාහිමියන් ඉන්දියාවේ සිට බුදුදහම සහ බෞද්ධ සාහිත්‍යය රැගෙන ආ නමුත් ඉන්දීය සංස්කෘතිය මෙහි තහවුරු කිරීමට උත්සාහ නොකළ බව පැහැදිලිව සඳහන් කළ හැකිය. ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයේ බුදුරජාණන් වහන්සේ විසින් විශාල චින්තන විප්ලවයක් සිදු කළත් එහි ශක්තිය භාරත සමාජය තුළ පැවතුනේ කෙටි කාලයක් පමණයි. නැවතත් බ්‍රාහ්මණ හින්දු සංස්කෘතිය ශක්තිමත් උනා. මිහිඳු මාහිමියන්ට අවශ්‍ය වූයේ හින්දු සංස්කෘතියෙන් බැහැරව බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් සහ බෞද්ධ ආචාරධර්ම පදනම්වූ දේශීය සංස්කෘතියක් මේ රටෙහි ගොඩනැගීමයි.


මිහිඳු මාහිමියන් වැඩමවන විට ලංකාවේ ජීවත් වූයේ ඉන්දියාවෙන් සංක්‍රමණය වූ විජය ඇතුලු පිරිසගෙන් පැවත එන්නන් පමණක් නොව, අනාදිමත් කාලයක මෙරට නිජභූමිය කරගත් විවිධ ගෝත්‍රවලට අයත් ජනකොටස් ජීවත් වූ බවට බොහෝ සාක්ෂි ඇත. ඒ සමඟම එකී ජනකොටස් අතර පැවති විවිධ ඇදහීම් හා විශ්වාසයන්ද සමාජය තුළ දක්නට ලැබිණ. බුදුදහම මිථ්‍යා විශ්වාස බැහැර කරන ආගමක් වුවත් උන්වහන්සේ දේශීය ඇදහිලි සහ විශ්වාස බැහැර කිරීම වෙනුවට ඒ සඳහා බුදුදහමට අනුගත විකල්ප ඉදිරිපත් කරමින් ජනතාව වෙත සමීපවූහ. ඒ පිළිබඳ ඉතා පැහැදිලි ප්‍රධානතම නිදර්ශනය නම් එකල සමාජයෙහි පැවති වෘක්ෂ වන්දනාව වෙනුවට බෝධි වන්දනාව ආදේශ කිරීමය. බෝධි වෘක්ෂය බුදුන් වහන්සේ නියෝජනය කරන අතර බෝධි වන්දනාව යනු බුද්ධ වන්දනාවක් ලෙස මෙරට ජනතාවට හඳුන්වා දීමට උන්වහන්සේ සමත් වූහ. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිව වැඩම කරවීමත් සමඟ ඇති වූ පුද පූජා වන්දනා ක්‍රම තුළින් වෙනත් කිසිම රටක නොමැති බෝධි සංස්කෘතියක් අප රටෙහි බිහිවූ බව සාහිත්‍ය කලාව ඇතුලු විවිධ ක්ෂෙත්‍රවල සංවර්ධනය තුළින් පැහැදිලි වෙයි.



**මහාචාර්ය බෙල්ලන්විල විමලරතන හිමි**

බුදුදහම කිසියම් දේශයකට, ජන වර්ගයකට සීමා කළ හැකි ආගමක් නොවේ. එහෙත් මිහිඳු මාහිමියන්ගේ අරමුණ වූයේ එය ශ්‍රී ලාංකිකයන්ට දේශයේ උරුමයක් බවට පත්කර ගනු දැකීමයි. ඒ අනුව උන් වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කෙළේ ඔබ රටෙහි බුදුදහම තහවුරු වීමට නම් ස්වදේශිකයන් මහණ උපසම්පදාව ලබා දේශයේ භාෂාවෙන් ධර්මය පැහැදිලි කිරීමේ ශක්තිය ඇති කර ගතයුතු බවය. උන්වහන්සේ අපේක්ෂා කළ ආකාරයටම කෙටි කාලයක් තුළ ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් සසුනට ඇතුලත්වීම නිසා තවදුරටත් ඉන්දියාවෙන් ධර්මදූතයන් ගෙන්වීමට අවශ්‍යවූයේ නැත. සිංහල භික්ෂූන් වහන්සේලා සිංහල භාෂාවෙන් බණ කියන්ට සමත් වීමත් සමගම ලක්ෂණ එකතුවෙමින් අද දක්වා ප්‍රවර්ධනය වී ඇත්තේ අපටම ආවේණිකවූ සිංහල බුද්ධාගමයි. එය ඉන්දියාවේ අශෝක රජුගෙන් පසු බිහිවූ බුද්ධාගම හෝ චීනය, ජපානය, කොරියාව ආදී රටවලට ගිය බුද්ධාගම හෝ නොවේ. කණගාටුවට කරුණ නම් දේශයේ අනන්‍යතාවය වූ සිංහල බුද්ධාගම පසුකාලයෙහි පැමිණි ද්‍රවිඩ සහ වෙනත් ජාතීන් වෙත සාර්ථක ලෙස සන්නිවේදනය නොවීමයි. එහෙත් ඔවුන් අතර ආගමික වෙනස්කම් දක්නට නොලැබුන ද බුදු දහමින් ලැබුණු ජාතික සංස්කෘතික ලක්ෂණ එදිනෙදා ජීවිතයෙහි ක්‍රියාකාරීත්වය තුළ ප්‍රකටව පෙන්නුම් කරයි.

සිංහල බෞද්ධ සංස්කෘතය යනු සිංහලයන්ට පමණක් සීමාවූ පටු ජාතිවාදී සංකල්පයක් නොවේ. එහි අන්තර්ගත වන්නේ අපගේ දේශයට උරුමවූ ජාතික අනන්‍යතාවයයි. එහි පැහැදිලි වන්නේ ජාති ආගම් වර්ගභේද වලින් තොර සියලු දෙනා සමඟ සහජීවනයෙන් ක්‍රියාකළ හැකි නම්‍යශීලීත්වයයි. පොසොන් දිනයන්හි වැදගත්කම වන්නේ මිහිඳු මාහිමියන් අපට ලබාදුන් මෙම උත්තරීතර පණිවිඩය බටහිර අර්ථ කථන වලින් විකෘත කිරීමට ගැති නොවී සියලු ජන කොටස් අතර සමගිය සාමූහිකත්වය වර්ධනය කෙරෙන දේශීය අනන්‍යතාවය ශක්තිමත් කිරීමට ක්‍රියා කිරීමයි.



# පුදබිමක් හඳුනා ගනිමු.

## සෝමාවතිය

ක්‍රි. පු. තුන්වන සියවසේදී ශ්‍රී ලංකාද්වීපයට බුදු සසුන ප්‍රවිශ්ඨ වීමෙන් අනතුරුව මෙරටට අත් වූ ශ්‍රේෂ්ඨතම දායාදය වූයේ භික්ෂු ශාසනය ස්ථාපිත කරවීමයි. භික්ෂූන් වහන්සේලා විසින් දිවයින පුරා දායකකාරකාදීන්ගේ අනුග්‍රහය මත වෙහෙර විහාරස්ථාන ඉදිකිරීම ආරම්භ විය. මෙම විහාරස්ථානවල ප්‍රධාන පූජ්‍යවස්තුව වූයේ ස්තූපයයි. වෙහෙර විහාරස්ථානවලට බැතිමතුන් ඇදී ආවේ බුදුන්වහන්සේ නියෝජනය කිරීම සඳහා උන්වහන්සේගේ සර්වඥධාතු තැන්පත් කළ චෛත්‍ය රාජයාණන් වහන්සේ නිසාය.

සෝමාවතී දාගැබද එපරිද්දෙන් බැතිමතුන්ගේ ඉමහත් භක්තියට පාත්‍ර වූ චෛත්‍යය රාජයාණන් වහන්සේ නමකි. අනුරාධපුර රුවන්වැලිසෑය මෙන් බුබ්බුලාකාර හැඩයෙන් යුත් හැට රියනක් උස චෛත්‍යකි.



### ඉතිහාසය

මෙම පුණ්‍ය භූමියේ ඉතිහාසයෙන් බිඳක් මෙසේයි. එකල මෙරට ප්‍රධාන රාජධානිය වූ රජරට හැරුණු විට තවත් කුඩා රාජ්‍යයන් කීපයක් පැවති බවට මහා වංශයෙන් තොරතුරු ලැබේ. දකුණු ශ්‍රී ලංකාවේ මාගම නමින්ද, බටහිර ප්‍රදේශයේ කැළණිය නමින්ද ඊසාන දිග්භාගයේ සේරුනුවර නමින්ද කුඩා රාජ්‍යයන් පැවති අතර ලෝණ නුවර ගිරිනුවර ආදී වශයෙන් තවත් කුඩා රාජ්‍යයන් පැවති බව ධාතුවංශයෙන් හෙළිදරව්වේ.

අභය කුමාරයා කාවන්තිස්ස රජතුමාගේ සොහොයුරිය වූ සෝමාදේවිය සරණ පාවාගෙන සේරුනුවර අභියස අලුතෙන් නගරයක් ඉදිකරවා ගෙන එම නුවරට සෝමනුවර යැයි නම් තබා එහි වාසය කළේය. (මෙම අභිනව නගරයට පිවිසීමට පෙරාතුව අභය රජතුමා සෝමාදේවිය සමඟ ගිරිනුවර වාසය කළේය. එබැවින් මොහුව ගිරි අභය නොහොත් ගිරි අබා නමින් හැඳින්විය.) මෙම අලංකාර නගරය තුල දාගැබක් සහිත විහාරයක් කරවීමට සෝමාදේවිය තුළ වූ අදහස නිසා එම නගරයට අභියස වූ මහා සල්වනයක එම විහාරය ඉදිකිරීමට තීරණය කළේය.

එකල්හි මහා අරිට්ඨ තෙරුන්ගෙන් පැවත එන මිහිඳු නම් තෙරනමක් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේ හැට නමක් ඒ අභියස වාසය කලහ. අභය රජතුමා තම විහාරය කරවීමේ අදහස මේ මිහිඳු තෙරුන් වහන්සේට දැන්වූ කල්හි උන්වහන්සේ පුදපූජා පවත්වමින් තිබූ බුදුන්වහන්සේගේ දකුණු දළදා වහන්සේ මේ දාගැබෙහි නිදන් කිරීමට අභය රජතුමාට දෙවා වදාල සේක. (නන්ද නම් මහ රහතන් වහන්සේ විසින් ඉන්දියාවේ සිට මෙහි මැඩම කරවනු ලැබූ බුදුන්වහන්සේගේ දකුණු ශ්‍රී දන්තධාතූන් වහන්සේ අරිට්ඨ නම් මහරහතන් වහන්සේ නමකට අයත්ව තිබුණි. අරිට්ඨ මහ රහතන් වහන්සේගෙන් පසුව පරම්පරානුගතව හිමිවෙමින් පැවති මේ දළදා වහන්සේ පසුව මිහිඳු තෙරුන් වහන්සේ අතට පත්වී තිබූ අතර ගිරි අබා රජු විසින් ඉදි කරනු ලැබූ සෝමාවතී චෛත්‍යයේ තැන්පත් කරනු ලැබුවේ ඒ දකුණු ශ්‍රී දළදා වහන්සේය.)

රජතුමා අති උත්කර්ශවත් අන්දමින් දකුණු දළදා වහන්සේ වැඩම කරවාගෙන ගොස් සුභ නැකතින් මහා පූජා පවත්වා දාගැබ තුල නිදන් කරනු ලැබීය.

මෙම චෛත්‍යය රාජයාණන් ඇතුළු විහාර භූමිය සියදේවියගේ නමින් සෝමාවතිය යැයි නම් තබා මිහිඳු තෙරුන් වහන්සේට අතපැන් වත්කර පිළිගැන්වූ බවද ඉතිහාසයේ සඳහන් වේ.

### පිහිටීම

සෝමාවති චෛත්‍ය පිහිටා ඇත්තේ පොළොන්නරු දිස්ත්‍රික්කයේ කුඩාවැටිය තුලානේ මින්විල්ලු නැමැති ග්‍රාමයේය. පොළොන්නරු නගරයේ සිට සැතපුම් 28 පමණ ගිය තැන මෙම ඓතිහාසික දාගැබ හමුවේ.


### හාස්කම්

මෙම චෛත්‍යය රාජයානන් වහන්සේ ආරක්ෂා වීමට විවිධ හාස්කම් බලපෑ බැව් ජනප්‍රවාදයේදී දක්නට ලැබේ. සොරසතුරන් විසින් කීපවතාවක් මෙහි නිදන් කොල්ල කෑමට දැරූ උත්සාහයන් සොබාව ධර්මය විසින් වැලකූ අන්දමත් අලි ඇතුන් මෙම භූමිය ආරක්ෂා කරගෙන සිටින ආකාරයත් ගැන විවිධ අන්දමේ තොරතුරු නිතර අසන්නට ලැබේ. උදේ පාන්දරම අලි ඇතුන් එකිනෙකා පේලි ගැසී චෛත්‍යය රාජයානන් වන්දනා කරන බැව්ද අසන්නට ලැබේ. සමහර කොල්ල කරුවන් මෙම අලින්ගෙන් පහරකා චෛත්‍යය අසලම මිය ගොස් ඇතැයිද පැවසේ.

බොහෝ දිනවල මෙම චෛත්‍යරාජයානන්ගෙන් බුදුරැස් විහිදෙන බැව් ඡායාරූප වලින් සනාථ වී ඇත. ශ්‍රී දළදාවහන්සේලා දෙනමක් ශ්‍රී ලංකාද්වීපය සතුව ඇති අතර මින් එක් නමක් මහනුවර දළදා මැදුරෙත් අනෙක් නම සෝමාවතී චෛත්‍යය රාජයානන් වහන්සේ තුලත් වැඩ වාසය කරන්නේය.

### මෙත් සිතින් සෙත් පැතුම

සඳ මුදුනට නගී
සුදෝ සුදු වට්ටියක් මෙනි
ගස් වැල් අතු පතර
මලින් හා පලින් බර වේ
මල් සුවඳ සමඟ සිල් සුවඳ
දසත පැතිරේ
ලොව සසල විය
කිමද ඒ අරුමය
කුමරෙක්
බුදුබව ලැබූ
මිනිස් සිත දකින
පහන දැල්විය
දැනෙන දුක පහකරන
මඟ හෙළිවිය
සසර දුක නැති කරන
මහ නුවණ පහළ විය
ඒ වෙසක් අසිරිමත් දිනයයි
ඇදුරු තුමනි
ඔබ ද අපට පහනෙකි
මග සසර කෙටි කරන
දුන් ඔවා පින් බෙලෙන්
මහ සඟ ගුණ බලයෙන්
පතන්නෙමි, සියලු පැතුමන් හොඳින් ඉටුවන
ලෙසට



මෙත්සවිය සාමාජිකාවක්

# පැවිදි කිරීමට සුදුසු නුසුදුසු පුද්ගලයෝ



## මහාචාර්ය රේරුකානේ චන්දවිමල හිමියන්පාණන්ගේ කෘතියක් ඇසුරෙණි

සැමදෙනා ම පැවිදි කිරීමට සුදුස්සෝ නො වෙති. එබැවින් පැවිදි කරන ගුරුවරයන් විසින් සුදුස්සන් පමණක් තෝරා පැවිදි කළ යුතුය.

පණ්ඩකයාය, උභතෝබ්‍යඤ්ජනකයා ය. ථෙය්‍ය සංවාසකාය, ය, තිත්ථියපක්කන්තකයා ය, තිරශ්චීනයාය: මාතෘඝාතකයා ය, පීතෘඝාතකයා ය. අරහන්තඝාතකයා ය. ලෝහිතුප්පාදකයා ය, සංඝභේදකයා ය, භික්ඛුණි දූෂකයා ය. යන එකොළොස් දෙන පැවිද්ද ලැබීමට සම්පූර්ණයෙන් ම නුසුදුසු අභව්‍ය පුද්ගලයෝය. නො දැන ඔවුන් පැවිදි කළත් ඔවුනට මහණකම නො පිහිටන්නේ ය. නො දැනීමකින් ඔවුන් පැවදි කර ඇති නම් දැනගත් විට සිවුරු හරවා යැවිය යුතුය. යම්කිසි භික්ෂුවක් විසින් දැන ඔවුන් පැවිදි කළහොත් ඒ භික්ෂුවට ඇවැත් වේ.

තවත් හත්ථච්ඡින්නාදි පුද්ගලයන් දෙතිස් දෙනකු පැවිදි නො කළ යුතු බව වදාරා තිබේ. යම්කිසි භික්ෂුවක් විසින් ඔවුන් ගෙන් එකකු පැවිදි කළ හොත් ඔහුට මහණකම පිහිටයි. එහෙත් පැවිදි කළ භික්ෂුවට ඇවැත් වේ. කියන ලද දෝෂයන්ගෙන් මිදුණු පුද්ගලයකු වුවද තථාගතයන් වහන්සේ වදාරා ඇති පරිදි මාපියන්ගේ අනු දැනීමක් නැති පුත්‍රයා ද පැවිදි නො කළ යුතුය. පැවිදි කරනු ලැබුවහොත් ඔහුට ද මහණකම පිහිටයි. පැවිදි කළ භික්ෂුවට දුකුලා ඇවැත් වේ.

නොයෙක් හේතූන් නිසා නොයෙක් අදහස්වලින් පැවිදි වන්නට උත්සාහ කරන්නෝ වෙති. තමන් ගේ මා පියන් සහෝදර සහෝදරියන් සමඟ ද සමඟියෙන් යහතින් නො විසිය හැකි ඇතැම් නොහික්මුණු අය අන්‍යයන් සමඟ සමගියෙන් නො විසිය හැකි නිසා ම පැවිදි ජීවිතයට බැස ගැනීමට උත්සාහ කරති. තවත් සමහරු බලාපොරොත්තු කඩවීම් වලින් වූ සිත් වේදනාව නිසා පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු යම් යම් උත්පත්ති දෝෂ නිසා ඥාතීන් විසින් නොපිළිගන්නා බැවින්ද පහත් කොට සලකන බැවින් ද පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු සිවුරට මුවා වී යම් යම් නොමනා අදහස් ඉටු කර ගැනීමේ අදහසින් පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු පහසුවෙන් ජීවත් විය හැකි වෙතියි සිතා පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු තමන්ගේ යම්කිසි අදහසක් ඉටු කර ගන්නා රිසියෙන් දරුවන් පැවිදි කර වන්නට උත්සාහ කරති. අතීතයේ දී පැවිදි ව රහත් වූ ධ්‍යානාභිඥාඋපදවා ආකාශ ගමනාදි අද්භූත දේ සිදුකළා වූ ද උත්තම පුද්ගලයන්ගේ චරිත අසා හෝ පොත පතින් කියවා හෝ පැවිදි වුව හොත් තමන්ටත් ඒ තත්ත්වයට පැමිණිය හැකි වෙතියි සිතා ඇතැමෙක් පැවිදි වන්නට තැත් කරති. මෙසේ නොමනා අදහස්වලින් මෝඩ අදහස් වලින් පැවිදි වන්නට එන්නන් පැවිදි කළ හොත් ගුරුවරුන්ටත් අන්‍ය භික්ෂූන්ටත් සමහර විට ඔවුන් ගෙන් බොහෝ කරදර පැමිණිය හැකි ය. එබැවින් කියන ලද පුද්ගලයන් ද පැවිද්දට නුසුදුසු බව කිව යුතුය.

සසර දුකින් මිදී නිවනට පැමිණීමේ බලාපොරොත්තුවෙන් ශ්‍රද්ධාවෙන් ම පැවිදි වන්නට තැත් කරන අය අතර ද කිසිවකුට කීකරු කරගත නො හෙන දරුණු අසත්පුරුෂ පුද්ගලයෝ ද වෙති. ශ්‍රද්ධාව වනාහි කලින් කල අඩු වැඩි වන ඇති නැති වන ධර්මයෙකි. එය පෘථග්ජන පුද්ගලයන් කෙරෙහි සෑම කල්හි එක පමණට නොපවතී. අසත්පුරුෂයා ඔහු තුළ ශ්‍රද්ධාව උත්සන්නව තිබෙන තුරු හොඳ පැවිද්දකු වශයෙන් සිටී. ශ්‍රද්ධාව හීන වූ පසු නැති වූ පසු ඔහුගේ නපුරු ගති මතුකරන්නට පටන් ගනී. සමහර විට එබඳු අය පැවිදි ව පසු කාලයේ දී භාජන ටිකත් බිඳ දමා පන්සලටත් ගිනි තබා පලා ගිය මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ගෝලයා මෙන් ගුරුවරුන්ට හා අන්‍ය භික්ෂූන්ටත් මහත් අනර්ථ කරන්නාහ.

සසර දුකින් මිදී නිවන් පුරයට පැමිණීමේ අදහසින් පැවිදි වන්නට එන අය අතුරෙන් ද පැවිදි කළ යුතු අය ඉවසීම ඇති, අන්‍යයන් හා සමගියෙන් වාසය කළ හැකි, සාධාරණ අදහස් ඇති, මෛත්‍රී කරුණා ගුණ ඇති, ගුරුන් ගේ අවවාදානුශාසනා ආදරයෙන් පිළිගන්නා ස්වභාවය ඇති, ගුරු ගෞරවය ගුරු භක්තිය ඇති අවංක සත්පුරුෂ යෝය. එබඳු පුද්ගලයෝ ම මේ බුදුසස්නෙහි දියුණුවට පැමිණෙන්නාහ. බුදු සස්න බබලවන්නෝ ද ඔවුහු ම ය.

## කුලපුත්‍රයන් පැවිදි කිරීමට සුදුසු ආචාර්යවරයෝ

මේ බුදු සස්නෙහි පැවිදි කොට ගෝලයන් තැනීම ද බරපතල කරුණෙකි. තමන් පැවිදි කරගත් ගෝලයන් ගේ කුඩා මහත් වරදවල් සොයා බලා ඒවා ගැන අවවාද අනුශාසනා කොට ඔවුන් සුමඟ යැවීමටත්, ධර්මවිනය උගන්වා ඔවුන් දියුණු කිරීමටත් නො සමත් අව්‍යක්ත භික්ෂූන් විසින් පැවිදි කරනු ලබන කුලපුත්‍රයෝ නොමඟ ගොස් දෙලොවින් ම පිරිහෙති. ගෝලයකු හික්මවීමට හා ඔහුට ප්‍රතිපත්ති පුහුණු කිරීමටත් ධර්ම විනය උගන්වා දීමටත් නොසමත් භික්ෂූන් අන්‍යයන් මහණ කිරීම ඒ අයට බලවත් අපරාධයක් කිරීමකි. එබැවින් තථාගතයන් වහන්සේ සියලු ම භික්ෂූන්ට ගෝලයන් තැනීමට අවසර නොදුන් සේක. උපසම්පදා වී දවසක් හෝ ඊට වැඩි කලක් හෝ ගත කොට ඇති ව්‍යක්ත ප්‍රතිබල වූ භික්ෂූන් හට ම ගෝලයන් තැනීමට අවසරදී වදාළ සේක. සුදුසුකම් නැති භික්ෂුවක් විසින් තමා උපාධ්‍යාය වී ගෝලයකු මහණ කළ හොත් ඇවැත් වේ.

උපාධ්‍යාය වී ගෝලයන් තැනීමට සුදුසු නුසුදුසු පුද්ගලයන්ගේ අංග තථාගතයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් වදාරා ඇත්තේ ය. ඒවා මහාවග්ග පාළියේ මහාඛන්ධකයෙන් දත හැකි ය. යටත් පිරිසෙයින් උපසම්පදාවෙන් දසවසක් ගත කොට ඇත්තා වූ ද, ගෝලයා හට තුදුස් ඛන්ධකයවත් පුරුදු කරදීමට හා ධර්ම විනය පුහුණු කිරීමට සමත් වූ ද, අනභිරතියක් ඇති වුව හොත් එය දුරු කිරීමට සමත් වූ ද, යම්කිසි කරුණක් ගැන සැකයක් ඇති වුව හොත් ධර්ම විනයානුකූලව එය දුරු කර දීමට සමත් වූ ද, ගෝලයා රෝගාතුර වුවහොත් උපස්ථාන කිරීමට හෝ කරවීමට සමත් වූද, භික්ෂුව ගෝලයන් මහණ කිරීමට සුදුසු වන්නේ ය. ලොකු පන්සල් නැති බව, පොහොසත් දායකයන් නැති බව, බොහෝ පන්සල් නැති බව, වතු කුඹුරු නැති බව, පිරිවෙන්වලට විද්‍යාලයවලට ගෝලයන් යවා උගැන්වීමට වත්කම් නැති බව යන මේවා විනයේ හැටියට ගෝලයන් පැවිදි කිරීමට නුසුදුසු කම් නොවන බව කිව යුතු ය. එහෙත් මේ කාලයේ හැටියට නම් තමාගේ කැමැත්තේ සැටියට පාලනය කිරීමට බලය ඇති තැනක් නැත්තා වූ භික්ෂුව විසින් අන්‍යයන් පැවිදි කිරීමට බලය ඇති තැනක් නැත්තා වූ භික්ෂූන් විසින් අන්‍යයන් පැවිදි කිරීම සුදුසු යයි නො කිය හැකිය.

කුලදරුවකු පැවිදි කොට අවවාදඅනුශාසනා කරමින් ඔහු හික්මවන්නා වූ ඔහුගේ සැපදුක් බලන්නා වූ ධර්ම විනය උගන්වා ඔහු දියුණු කරන්නා වූ ආචාර්යවරයා උපාධ්‍යාය නම් වේ. "උපජ්ඣායො භික්ඛවෙ, සද්ධිවිහාරිකම්හි පුත්තචිත්තං උපට්ඨපෙස්සති, සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතුචිත්තං උපට්ඨපෙස්සති" යි තථාගතයන් වහන්සේ විසින් වදාර ඇති පරිදි උපාධ්‍යායයා ගෝලයා විසින් ද උපාධ්‍යායයා කෙරෙහි පියෙක යන සිත තබා ගත යුතුය. එසේ අන්‍යෝන්‍ය හිතවත් භාවයෙන් වාසය කිරීමෙන් මේ සස්නෙහි ඔවුහු දියුණුවට පැමිණෙන්නාහ.

# කර්ම විපාක

## මල් පූජාවේ ආනිසංස

පදුම හිමි පෙර ජීවිතයකදී පදුමුත්තර බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට එක් පියුමක් ගෙන පූජා කළ පිනෙන් මල්පෙති ගණනට සක්විති රජව ඉපදුනාහ. හත්සිය වතාවක් පෘථිවි රාජ්‍යය කළා. අවසානයේ නිවන් සුව ලැබීමට ඒ පින හේතු වූ බව පෙන්වා දී ඇත.

තිළුප්පල මාලිය හිමි විපස්සී බුදුරජුට උපුල් මල් තුනක් පුදා කල්ප අනූ එකක් දුගතියකට නොයන ලදි. මේ පිනෙන් තුන්සිය වතාවක් සක්දෙව්රජ වී ඉපදුනාහ. පන්සිය වතාවක් සක්විති රජවුනා. අවසානයේ නිවන් දැකීමට ද මේ පින උපනිශ්‍රය වුනා. බලන්න සත්පුරුෂයෙනි, හැදුනු සිතකින් පින්කම් කිරීමේ අගය

සත්තුප්පමාලක ථෙරණිය පෙර ජීවිතයක සිඛි බුදු රජාණන් වහන්සේට මහනෙල් මල් සතක් එකඟ සිතින් නුවණ යොදා පිදූ පිනෙන් වාර හැත්තෑ හතක් දෙදෙව්ලොවට අධිපති සක්දෙවිඳුගේ බිරිඳ ව උපන්නාය. ඒ මලේ පාට හා සුවඳ ඇයට හැම දිවියකම ලැබුණු අතර අවසානයේ නිවනට ද මේ පින උපනිශ්‍රය විය.

නිකණිකාර පුප්වීය හිමි සුමේධ බුදු රජාණන් වහන්සේට කිණිහිරියා මල් තුනක් පැහැදුන සිතින් නුවණ යොදා පූජා කළ පිනෙන් තුන්සිය වතාවක් සක්විති රජ විය. පන්සිය වතාවක් සක්දෙව් තනතුර ද හැම ජීවිතයකදීම පහත සඳහන් විපාක ද ලැබුවා.

01. මහත් බෝග සම්පත් ඇත්තෙකු වුනා.
02. පහත් කුලවල නොඉපිද උසස් කුලවලම ඉපදුනා.
03. කැමැති කැමැති යාන වාහන ලැබුනා.
04. බොහෝ රූමත් ස්ත්‍රීන් හා දාසි දස්සන් ලැබුනා.
05. බොහෝ අගනා වස්ත්‍රාභරණයන්ට ලාභී වුනා.
06. සෑම කල්හි අන් අයගේ ගෞරවයට පාත්‍ර වුනා.
07. උසස් කීර්තියක් ඇත්තෙක් වුනා.
08. සැමකල්හි බොහෝ පියවර ජනයා ඇත්තෙක් වුනා.
09. තම පිරිස කිසිවෙකුට භේද කළ නොහැකි වුනා.
10. ඥාතීන් අතර උසස් (උතුම්) ශ්‍රේෂ්ඨයෙකු වුනා.
11. ශීත උෂ්ණ වලින් පීඩාවක් වුනේ නෑ.
12. කායික දාහ මානසික දාහ නැති උතුමෙක් වුනා.

අවසානයේ නිවන් සුව අවබෝධයට ද ඒ උතුම් පින උපනිශ්‍රය වුනා.

## සුවඳ දුම් පූජාවේ ආනිසංස

ධූපදායක හිමි පැහැදුනු එකඟ වූ සිතින් බුද්ධිය යොදා සිද්ධාර්ථ බුදුරජුන්ගේ ගඳ කිළිය සුවඳවත් කළ පිනෙන් කල්ප 49 ක් අපායට නොගොස් නිවන් දැකීමට එම කුසලය උපනිශ්‍රය වී ඇත.

පිළින්දිවච්ඡ මහ රහතන් වහන්සේට සුවඳ දුම් පිදූ පිනෙන් අනුසස් දහසක් ලැබුණු බව දක්වා ඇත.

01. සුවඳවත් සිරුරක් ඇත්තෙකු වේ.
02. කීර්තිමත් ජීවිතයක් ලැබේ.
03. යසස් ඇත්තෙකු වේ.
04. වහා වැටහෙන නුවණක් ලැබේ.
05. තීක්ෂණ නුවණ ලැබේ.
06. භූරි පඤ්ඤ යන නුවණ ලැබේ.
07. හාසු පඤ්ඤ යන නුවණ ලැබේ.
08. ගැඹුරු නුවණ ඇත්තෙකු වේ.
09. විපුල වූ නුවණක් ලැබේ.
10. ජවන ප්‍රඥාව ලැබේ.

එබැවින් සත්පුරුෂයෝ තැන්පත් සිතින් යුතුව කුසල කර්ම කෙරෙත්වා.

## පහන් පූජාවේ (විපාක) ආනිසංස

අජිත ස්වාමීන් වහන්සේ පියුමතුරා බුදු රජුට එක් මීතෙල් පහනක් පිදූ පිනෙන් කල්ප හැට දාහක් දෙව්ලොව සැප විඳ දහස් වතාවක් සක්විති රජුව උපන්නේය. සතිස් වතාවක් සක් දෙවිඳු වුණා. වාර සත්සියයක් ප්‍රදේශ රජ වුණා. අවසානයේ නිවන දැකීමට ද ඒ කුසලයම උපනිශ්‍රය වූ බව දක්වේ.

පඤ්චදිපිකා ථෙරණින් වහන්සේ පෙර බුදු සසුනක කළුවර රැයක බෝධීන් වහන්සේට පහන් පහක් පිදූ පිනෙන් අසූ වාරයක් දෙව් ලොවට අධිපති සක්දෙවිඳුගේ බිරිඳ වී උපන්නාය. දහස් ගණන් සක්විති රජ දරුවන්ට අග මෙහෙසිය වුනාය. අප බුදු සසුනේ දී සත් අවුරුදු වියේදී නිවන් දැකීමට ද ඒ පින උපනිශ්‍රය වී ඇත.

සකුලා ථෙරණිය කාශ්‍යප බුදුරජුන් පිරිනිවීමෙන් පසු උන්වහන්සේගේ චෛත්‍යයට එක් රැයක් එක් පහනක් පුදා පහත සඳහන් ආනිසංස ලැබුණු බව ථෙරී අපදානයේ දක්වා ඇත්තේ ය.

01. දිවැස් ලැබේ.
02. තීක්ෂණ නුවණ ලැබේ.
03. යසසින් දිලිසෙත්.
04. ශ්‍රද්ධාව හා ප්‍රඥාව මනාව පිහිටත්
05. උසස් කුල සම්පත් ඇත්තෙකු වේ.
06. විෂම ස්ථාන වලට යන විට සම වෙන්නාහ.
07. විනිවිද පෙනෙන දෙනෙත් ඇත්තෙක් විය.

ඒකදීපිය හිමි සිද්ධාර්ථ බුදුරදුන්ගේ චිතකයට එක් පහනක් පුදා එක්තිස් වරක් සක්දෙවිඳු විය. විසි අට වතාවක් සක්විති රජ බව ද ලැබුවා. තවත් විශේෂ අනුසස් දෙකක් ලැබුවා.

පින්වතුනි පහන් සුවාසු දහසක් විසුරුණු කැළඹුණු සිතින් පිදුවත් මේ පමණ අනුසස් ගෙන නොදෙන අතර, පැහැදුන සිතින් එකඟ සිතින් බුද්ධිමත්ව එක පහනක් පිදුවත් මහත් අනුසස් ලැබෙන බව වටහාගනිත්වා.

## සුවඳ පැන් ඉසීමේ අනුසස්

ථුසිත කම්පිය හිමි විපස්සී බුදුරජාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය වඩින විට වනුක් මල් ටිකක් තම්බා ගත් සුවඳ පැන් ටිකක් ගෙන ඉස්ස පිනෙන් දෙදහස් පන්සිය වතාවක් සක්විති රජ විය. දෙදහස් පන්සිය වතාවක් දෙදෙව්ලොවට අධිපති සක්දෙවිඳු වී උපන්නේය. එසේම උපනුපන් ජීවිතයෙහි

01. හැම ආත්මයකදීම ථුසිත යන නම ද
02. සැමදා බඹයක් පමණ සුවඳ වැසී පොද වසියි.
03. සැතපුම් භාගයක් දුරට ඇඟෙන් සුවඳ විහිදේ
04. තම අතට ගත් සියල්ල සුවඳවත් වූහ.

කල්ප ලක්ෂයක් සැප විඳ එම කාලය තුළ පාරමීද පුරාගෙන නිවන් සුවයද අවබෝධ කරගත් බව අපදාන පාලියේ සඳහන් වේ.

ගන්ධෝදකීන හිමි පෙර ආත්මයක දී පියුමතුරා බුදුරජුන් පිට දුන් බෝධීන් වහන්සේ ට මහ වර්ෂාවේ නමුදු සුවඳ පැන් කළයක් පිදූ පිනෙන් දෙව්ලොව දිව්‍යාංගනාවන් පිරිවරාගෙන උසස් විමාන ලබා මනු ලොව දී ආබාධයෙන් තොරව, ශෝකයෙන් තොරව, ලතැවීමෙන් තොරව, පාරමී පුරාගෙන නිවන් දැකීමට ද ඒ පින උපනිශ්‍රය විය.

අපදාන පාලි ඇසුරෙනි

# සත්ත්වයන් උපදිනා ස්ථානයෝ

## හය හතර තේරීම

නරකය, ප්‍රේතලෝකය, අසුර ලෝකය හා තිරිසන් අපාය
යන සතර අපාය සහ දිව්‍යලෝක හය

### නරකය

සඤ්ජීව නරකය, කාල සූත්‍ර නරකය, සංඝාත නරකය, රෞරව නරකය, මහා රෞරව නරකය, තාප නරකය, ප්‍රතාප නරකය, අවීචි මහා නරකය යි මහා නරක අටකි. ඒවා සතරැස් ය. එක් මහා නරකයක එක් පසකින් සතර බැගින් ඔසුපත් නරක නම් වූ කුඩා නරකයෝ ද වෙති. එක් මහා නරකයක් හාත්පස ඇති කුඩා නරක සොළොසෙකි.

### සඤ්ජීව නරකය

යමපලුන් විසින් එහි උපන් සත්ත්වයන් ගිනියම් වූ පොළොවෙහි පෙරළා කඩ කඩ කොට කපද්දීත් ඒ සත්ත්වයන් නැවත නැවත ජීවත් වන බැවින් ඒ නරකය සඤ්ජීව නම් වේ. අධික ක්‍රෝධයෙන් හා මානයෙන් අනුන් හා කෝලාහල කළෝ ද, දුබලයන් පෙළූ රජවරු හා නිලධාරීහු ද, දිළින්දන් පෙළූ පොහොසතුන් හා මැරයෝ ද, සතුන් මරන්නෝ ද සඤ්ජීවයෙහි උපදිති.

### කාලසූත්‍ර නරකය

උපන් සත්ත්වයන් ගිනියම් වූ යපොළොවේ දැලි නූල් ගසා සසින්නා වූ ස්ථානය කාලසූත්‍ර නරකය යි. මාපියන්ට හා මිතුරන්ට ද ගුණවත් මහණ බමුණන්ට ද අපරාධ කළාහු එහි පැසෙති.

### සංඝාත නරකය

මේ නරකයෙහි සත්ත්වයෝ නවයොදුන් ඝන යපොළොවෙහි එරී නිශ්චල ව සිටිති. එහි අහස ගුගුරන්නාක් මෙන් මහ හඬ නංවමින් එරී සිටින නිරිසතුන් අඹරමින් පර්වතයෝ ඔබ මොබ පෙරළෙති. ඒවාට යටවී සත්ත්වයෝ සුණු විසුණු වෙති. ඇත් අස් ගවාදී සතුන්ට වද දෙමින් වැඩ ගත්තෝ ද සතුන් මැරුවෝ ද එහි උපදිති.

### රෞරව නරකය

මේ නරකයෙහි සත්ත්වයන්ගේ සිරුර තුළට වැද ඇතුළත දවන්නා වූ තපුරු දුමක් ඇත්තේ ය. ඇතුළත පිටත දෙක ම දවනු ලැබීමෙන් හඬන නිරි සතුන්ගේ හඬ නිරතුරු ව එහි ඇසෙන බැවින් එයට රෞරව නරකය යි කියනු ලැබේ.

### මහා රෞරව නරකය

අතිශයින් රෞද්‍ර වූ ගින්නෙන් හා දුමින් තවනු ලබන සත්ත්වයන්ගේ නිරතුරු පවත්නා මහ හඬ ඇති නිසා ද, නිරිසතුන්ගේ ශරීරවලින් ගලන පිරී තිබෙන නිසා ද ඒ නරකයට මහා රෞරව නරකය යි කියනු ලැබේ. තුනුරුවන් අයත් වූ ද මාපියන් අයත් වූ ද වස්තුව පැහැර ගත්තෝ ද විනාශ කළෝ ද එහි උපදිති.

### තාප නරකය

මේ නරකයෙහි යමපලුන් විසින් ගිනියම් වූ යපොළොවෙහි ගිනියම් වූ යහුල්වල අමුණා තබනු ලැබූ සත්ත්වයෝ ගින්නෙන් දැවෙමින් වෙසෙති. සතුන් පණ පිටින් දවා මැරුවෝ ද අනුන්ගේ ගෙවල් ගිනි තැබූවෝ ද එහි උපදිති.

### ප්‍රතාප නරකය

මෙහි ද තාප නරකයෙහි නිරිසතුන් පැසෙන අයුරින් දීර්ඝ කාලයක් සත්ත්වයෝ පැසෙති.  යනු ද මේ නරකයට නමෙකි. මරණින් මතු ඉපදීමක් නැත යයි මිථ්‍යාදෘෂ්ටි ගෙන පව්කම් කළ අය එහි උපදිති.

### මහා අවීචි නරකය

මේ නරකයෙහි එක් බිත්තියකින් නැගෙන ගින්න අනික් බිත්තිය දක්වා ගමන් කරන්නේය. පොළොවෙන් නැගෙන ගිනි ජාලාව උඩ පියන් පත දක්වා නගින්නේ ය. උඩ පියන් පතින් නික්මෙන ගිනි ජාලාව පොළොව දක්වා බස්නේය. සත්ත්වයෝ නිතර ම සදිසාවෙන් එන ඒ ගිනි දැල්වලින් වෙළීදැවෙන්නෝ ය. අතරක් නැති ව එහි සත්ත්වයෝ ද වෙසෙති. ගිනි දැල්වලින් හා දුක්වලින් ද සත්ත්වයන්ගෙන් ද අතරක් නැති බැවින් ඒ නරකය අවීචි නම් වේ.

පඤ්චානන්තර්‍ය කර්ම කළෝ ද බෝසතුන් නැසුවෝ ද ගුණවතුන් නැසුවෝ ද චෛත්‍ය බින්දෝ ද පිළිම බින්දෝ ද බෝරුක් නැසුවෝ ද රත්නත්‍රයට අයත් වස්තුව පැහැර ගතුවෝ ද මිත්‍ර ද්‍රෝහීහු ද භාර්යාවන්ට අපරාධ කළෝ ද බොරු කීවෝ ද සුරාපානය කළෝ ද මිසදිටු ගතුවෝ ද එහි උපදිති.

කුඩා නරකයෝ

### ලෝකාන්තරික නරක

ලෝකාන්තරික නරකය යනු මහත් වූ ශීත නරකයෙකි. එය හැම කල්හි ම ගනඳුරින් වැසී තිබේ. එහි පත්ලෙහි අතිශයින් ශීතල ජලය ඇත්තේ යි නිරිසත්තු වවුලන් සේ පර්වතයට එල්ලී ඔබමොබ යති. ඔවුහු තවත් සත්ත්වයකු දුටු කල්හි ආහාරයකැ යි සිතා අල්ලා ගැනීමට තැත් කෙරෙති. එයින් දෙදෙනාම පර්වතයෙන් ගිලිහී දියට වැටෙති. එහිදී හුණු තෙල්හි ලූ පිටි බැදෙන්නාක් මෙන් ඔවුන්ගේ ශරීරයෝ පුපුර පුපුරා ශීතලයෙන් බැදෙති.

### තිරිසන් අපාය

මිනිස් ඇසට නො පෙනෙන තරම් ඉතා කුඩා සත්ත්වයාගේ පටන් යොදුන් ගණනක් ඇති සත්ත්වයන් දක්වා සිටින, පා නැත්තා වූ ද, දෙපා ඇත්තා වූ ද, සිව් පා ඇත්තා වූ ද, බොහෝ පා ඇත්තා වූ ද නොයෙක් සටහන් නොයෙක් ආකාර ඇත්තා වූ ද තිරිසන් සත්ත්ව සමූහය ම තිරිසන් අපාය ය. නරකය මෙන් ඔවුන්ට වෙන් වූ තැනක් නැත. ඔවුහු උපනුපන් ඒ ඒ තැන්වල ම ඔවුනොවුන් කා ගනිමින් කිසි පිළිසරණක් නැති ව නිරතුරු බියෙන් ත්‍රස්තව ජීවත් වෙති.

### ප්‍රේත අපාය

මිනිසුන්ගේ ප්‍රකෘති ඇසින් නොදැකිය හැකි ධාතු වර්ගයකින් නිර්මිත වූ නොයෙක් ප්‍රමාණ ඇත්තා වූ ද නොයෙක් සටහන් ඇත්තා වූ ද නොයෙක් ආකාර දුක් ඇත්තාවූ ද සත්ත්ව කොට්ඨාසයකට ප්‍රේතාපය යයි කියනු ලැබේ. ඔවුන්ට භූමියක් වශයෙන් නියම තැනක් නැත. ප්‍රේතයෝ බොහෝ සෙයින් අතිශයින් කෘශ වූ ඇට නහර මතු වී ඇති බඩේ සම පිට කටුවේ ඇලී ඇත්තාවූ දුටුවන්ට අප්‍රිය වූ ශරීර ඇත්තෝ ය. සාගින්න නිවෙන පමණට ආහාර ද පිපාසාව සන්සිඳෙන පමණට පැන් ද ඔවුහු නො ලබති. එහෙත් අකුශල බලයෙන් ඔවුහු බොහෝ කල් ජීවත් වෙති. ඔවුන් ගෙන් ඇතැමෙක් කවදාවත් ආහාර පාන නො ලබති. ඇතැම්හු මිනිසුන්ගේ සෙම් සොටු ආහාර කොට ගනිති. ඇතැම්හු මිනිසුන්ගේ හා තිරිසනුන්ගේ අසූචි ආහාර කොට ගත්තෝ ය. ඇතැම්හු මළකුණු ආහාර කොට ඇත්තෝ ය. ඇතැම්හු මිනිසුන් ඉවත ලන බත්හුලු ආදිය ආහාර කොට ඇත්තෝ ය. ඇතැම්හු තමන්ගේ ශරීරය ම සූරා කන්නෝ ය. ඇතැම්හු ඔවුනොවුන්ගේ වන වන පිලිකාවලින් ගලන ලේ සැරව ආහාර වශයෙන් ගන්නෝ ය.

### අසුරාපාය

අසුර යන නාමයෙන් දේව ගණයට අයත් කොටසක් ද ඇත්තේ ය. බෞද්ධ පොත්වල වේපචිත්ති අසුර, පහාරාද අසුර යනාදි නම් වලින් දක්වෙන්නෝ දේව ගණයට අයත් අසුරයෝ ය. ඔවුහු දෙවියන් මෙන් ම සැප ඇත්තෝ ය. අසුර යන නාමය ව්‍යවහාර කරන ප්‍රේතයන් වැනි දුඃඛිත සත්ත්ව කොට්ඨාසයක් ද ඇත්තේ ය. අසුරපාය යනු ඒ සත්ත්ව සමූහයමය. ඔවුහු ද ප්‍රේතයන් මෙන් ම නොයෙක් ආකාර ශරීර ඇත්තෝ යී

### සප්ත කාම ස්වර්ගය

මිනිස් ලොව ය, චාතුර් මහා රාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිර්මාණ රතිය, පරනිර්මිත වසවර්තිය යන මේ ස්ථාන සත දානාදි පින් කම් කළවුන් උපදනා සප්ත කාම ස්වර්ගය ය. එහි සයක් දිව්‍ය ලෝකයෝ ය. දිව්‍යලෝක වනාහි මිනිස් ඇසින් දැකිය නොහෙන, මිනිස් කයින් ස්පර්ශ කළ නොහෙන, ධාතු වර්ගයකින් නිර්මිත, ශෝභන විමානයන් හා මරණ බිය පවා අමතක වන තරමේ ප්‍රියංකර භාවයක් ඇති උයන් පොකුණු ආදියෙන් යුක්ත වූ පරම රමණීය ස්ථානයෝ ය. ඒවායින් ප්‍රයෝජන ලැබිය හැක්කේ දෙවියන්ටමය. දිව්‍යලෝකවල උපදනා දෙවියෝ වනාහි මිනිසුන් මෙන් කලක් මව් කුසයේ වැස හඬ හඬා දුකින් ඉපිද ක්‍රමයෙන් වැඩෙන්නා වූ සත්ත්ව කොටසක් නොව සර්වාංග ප්‍රත්‍යඞ්ගයන්ගෙන් සම්පූර්ණ ව පහළවීම් වශයෙන් උපදනා සත්ත්ව කොට්ඨාසයකි. ඔවුන්ගේ ජරාවක් ද නැත්තේ ය. ඔවුන්ගේ ආයුෂ ද ඉතා දිගය. ඔවුන්ගේ වස්ත්‍රාභරණ පරණ වන්නේ ද කිලිටි වන්නේ ද නොවේ. ඔවුනට ආහාරපාන සැපයීමට වෙහෙසීමක් ද නැත. දිව්‍ය ස්ත්‍රීහු දරුවන් නො වදති. දරුවන් වැදීමේ, දරුවන් පෝෂණය කිරීමේ කරදරය ඔවුන්ට නැත. ඔවුහු සෑම කල්හි ම නැටුම් ගැයුම් ආදියෙන් සිත් පිනවමින් වෙසෙති. අපාය සතරය, මිනිස් ලොවය, දිව්‍ය ලෝක සයය යන මේ එකොළොස් භූමියට කාම භූමිය යි කියනු ලැබේ.

- ප්‍රේතවස්තු වර්ණනාවෙනි -

# නිර්මාංශ ආහාර ව්‍යාපෘතිය

මෙත්සවිය මගින් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති නිර්මාංශ ආහාර ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා පිංවත් ඔබටද දායක විය හැක. මූල්‍යමය වශයෙන් හෝ ක්‍රියාකාරීව හෝ ඔබගේ හැකියාව මෙත්සවිය කාර්යාලයට දැනුම්දී වැඩිවිස්තර ලබාගත හැක. මෙයට ඔබ දක්වන අනුග්‍රහය මගින් සත්ව කොටස් අනුභවය අවම කොට අනියම් අන්දමකින් සත්ව ඝාතනයද අවම කිරීමේ පුන්‍ය කර්මයට දායක වූවා වන්නේය.

මෙම ව්‍යාපෘතිය තුලින් හෝටල් සහ ක්ෂනික ආහාර පාන අලවි සැල්වල 25% වැඩි ප්‍රමාණයක් නිර්මාංශ ආහාර අලවි කරනු ලබන්නේ නම් විශේෂ වූ නාමපුවරුවක් එම ව්‍යාපාරික ස්ථානයේ සවිකිරීම සහ මසකට වරක් පුවත් පත් මගින් ප්‍රචාර ලබාදීමටද බලාපොරොත්තු වේ. තවද පූර්ණ වශයෙන් නිර්මාංශ ආහාර පමණක් අලවි කරන ආපන ශාලා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අය හට මූල්‍යමය ආධාර ලබාදීමටද අදහස් කර ඇත.

මෙහි දෙවැනි අදියර වශයෙන් ප්‍රනීත නව නිපැයුම් ලෙස සෝයා ඇතුළු නිර්මාංශ ආහාර වර්ග වෙළඳ පොලට නිකුත් කරන ආයතන තෝරා ඒවාට දිරිමත් කිරීමේ ත්‍යාග සහ වෙනත් සහයෝගයන් ලබාදීමක් සිදු කිරීමට බලාපොරොත්තු වේ. එම නිශ්පාදකවරුනට නොමිළයේ වැඩමුළු පැවැත්වීමටද බලාපොරොත්තු වේ.

## පුණ්‍යානු මෝදනාව

### රෝදපුටු පරිත්‍යාග කිරීම

01. ජයවිගුණසේකර මහතා සහ එම මහත්මිය මහරෝහලට ලබාදීම පිණිස රෝදපුටුවක් පරිත්‍යාග කිරීම. (සා. අංක. 12 - 2095 - 2096)
02. සාවිත්‍රි මිය විසින් රෝදපුටුවක් සහ මෙබියුලයිසරයක් විජයාරාමාධිපති පූජ්‍ය ආනන්ද හිමියන්ට පරිත්‍යාගයක් පිණිස ලබාදීම. (සා. අංක. 11-1946)
03. පානදුර පදිංචි එම්. එම්. ආර්. ඩී. සිල්වා මහත්මිය රෝදපුටුවක් පරිත්‍යාග කිරීම.
04. පූජ්‍ය කොත්මලේ ඤාණවංශ හිමියන්ට ලබාදීම පිණිස ධනුෂ්ක වික්‍රමරත්න මහතා රෝදපුටුවක් පරිත්‍යාග කර ඇත. (සා. අංක. 11-2040)

### පරිගණක

01. චම්පිකා අල්විස් මෙනවිය විසින් කායභිලයට පරිගණකයක් පරිත්‍යාග කර ඇත. (සා. අංක. 12-2152)
02. පී. ශාලිකා චාන්දනී මහත්මිය පරිගණකයක් පරිත්‍යාග කර ඇත. (සා. අංක. 8-460)

### විශේෂ ආධාර

01. උදය පීරිස් මහතා රු. 50000/- පරිත්‍යාග කර ඇත
02. භාවනා වැඩසටහන් වල පරිහරණය සඳහා භාවනා සඳහා වූ පුටු 100ක් පූජා කල ජනක සුවඳරත්න මහතාට.
03. කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා විදුරු අල්මාරියක් පරිත්‍යාග කල අංජු ලිලංගා මියට.
04. එච්. එම්. බන්දුල සේන මහතා මෙත්සවිය සඟරාව මුද්‍රණයට අනුග්‍රහය රු. 10000/-
05. උදය සිරිවර්ධණ මහතා මෙත්සවිය සඟරාවේ පිටපත් 500කට මුද්‍රණ අනුග්‍රහය දක්වා ඇත
06. මෙත්සවිය කයභිලයේ වියදම් සඳහා එස්. එන්. ගුණතිලක මහත්මිය විසින් 2008 ජනවාරි මස සිට සෑම මසකම රු. 4000/- පරිත්‍යාග කරනු ලැබේ.
07. මෙත්සවිය කායභිලයේ රාක්ක සෑදීම සඳහා දිලිනි මිය, ඉන්දිරා මිය සහ අනෝමි මිය විසින් රු. 10000/- පරිත්‍යාග කර ඇත. (12-2190, 2192, 2193)
08. මෙත්සවිය 12 වන භාවනා කණ්ඩායම කායභිලයට දැන්වීම් පුවරුවක් පරිත්‍යාග කර ඇත
09. මෙත්සවිය මගින් නිතර පවත්වනු ලබන නොමිලේ ඇස් කණ්නාඩි ලබාදීමේ පුණ්‍ය කර්‍මයට දායක වී ඇස්කණ්නාඩි 100 ලබාදුන් අප සාමාජික ශානිකා නිලූෂා පෙරේරා මෙනවියටත් ඇයගේ දෙමාපියන් වන ෂර්ලි පෙරේරා මහතා සහ නන්දා පෙරේරා මහත්මියටත් බැති සිතින් පිං දෙමු.

   ඇස් පරීක්ෂා කිරීමට දායක වූ නුගේගොඩ සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස් අධිපතිනි මෙත්සවිය සාමාජිකා දාශ්ධි විශේෂඥනෙරංජලා කන්නන්ගර මහත්මියට සහ ඇයගේ ස්වාමි පුරුෂයා වන චන්න පෙරේරා මහතා ඇතුළු පිරිසට ද පුණ්‍යානුමෝදනා කරන්නෙමු.

   මෙහි නම සඳහන් නොකරන මෙන් ඉල්ලා ආධාර කල පිංවතුන්ටත් ආශිර්වාදකර සෙත් පතමු.

## මෙත් සිත් පෙරදැරිව සත්ව හිංසනය වලකා ශ්‍රී ලංකාව ධර්මද්වීපයක්ම කිරීමට ඔබගේ දායකත්වය ලබා දෙන්න.

මෛත්‍රී පෙරදැරිව නිර්මල ථේරවාදී බුදුදහම වැජඹෙන මෙම ශ්‍රී ලංකාද්වීපයේ තිබෙන අනේකවිධ සත්ව හිංසන වැලැක්වීම පිණිස නවනීති පනවන ලෙස බාරදීමට අමතරව පහත වැඩසටහන්ද ක්‍රියාත්මක වේ . ඒ සඳහා කැමති අයට ආධාර කල හැකිය.

### මෙත්සවිය ප්‍රාණඝාතය වැලැක්වීමේ CD තැටිය නැවත පිටපත් කොට බෙදා හැරීම

2550 සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් ඉහත CD තැටි 2550 පිටපත් කොට විහාරස්ථාන දහම් පාසැල්, වෙනත් පුණ්‍ය ආයතන වෙත නොමිලේ බෙදා හැරිය මුත් ඒ සඳහා ඇති අධික ඉල්ලුම සපුරාලීමට නැවත CD තැටි පිටපත් කිරීමට අවශ්‍ය වී ඇත. මෙය නැරඹූ බොහෝ දෙනා මස්, මාළු අනුභවය නවතා ඇත. CD තැටියක් නිෂ්පාදනය සඳහා බරපැන (කවරයද සමඟ) රු. 100 බැගින් කැමති ප්‍රමාණයකින් දායක විය හැක.

CD තැටි 100ක පිටපත් සඳහා අනුග්‍රහය දක්වන භවතුන්ගේ නම හෝ ආයතනයේ නම CD තැටියේ සහ කවරයේ මුද්‍රණය කල හැක.

## ශ්‍රී විජයාරාමයේ ධර්මශාලාව ප්‍රතිසංස්කරණය

මෙත්සවිය පවත්වාගෙන යනු ලබන ශ්‍රී විජයාරාමයේ ඉපැරණි ධර්මශාලාව ප්‍රතිසංස්කරණය කිරීමට අප සංසඳය තීරණය කර ඇති අතර මේ සඳහා ප්‍රතිපාදන සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. විශාල පිරිවැයක් යෙදවීමට සිදුවන මෙම පුණ්‍ය කටයුත්තට සියලු සාමාජික සාමාජිකාවන්ගේ පිංබර සහභාගිත්වය බලාපොරොත්තු වේ. ටයිල් ඇල්ලීමේ සිට වහල දක්වා සිදු කිරීමට නියමිත මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අප විසින් පහසු ගෙවීමේ ක්‍රමයකට ටයිල් කැට ගෙනැවිත් කාර්යාලය ඉදිරිපිට තබා ඇත. ඔබට හැකි ප්‍රමාණයක් ටයිල් කැටවලට කාර්යාලයට මුදල් ගෙවා මෙම පුණ්‍ය කටයුත්තට දායක වී අටවන කුසල් ගණයට අයත්වන මෙම මහඟු අවස්ථාව උදාකර ගන්න. එක් ටයිල් කැටයක වර්ග ප්‍රමාණය සඳහා වැයවන මුදල රු. 450/- කි. ( පොලවේ සිට වහලය තෙක් වර්ග අඩියක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා )

## මුද්දර ආධාර

මුද්දර ගාස්තු වැඩි වී ඇති බැවින් සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග කිරීම කැමති පින්වතුන් හට කැමති ප්‍රමාණයක මුද්දර කාර්යාලයට පරිත්‍යාග කරන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## සුව සෙත

ප්‍රාණ/විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් අය මගින් රෝග සුව කිරීමේ නොමිලයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේ දී ප.ව.12.00-2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.

## ප්‍රේතවස්තු ප්‍රකරණයෙන් සූකරමුඛ ප්‍රේතයාගේ කථාව

ලෝක ශිවංකර භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි වූ ලෙහෙනුන්ට වැටුප් තබා අභයදුන් හෙයින් කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන කල්හි මේ ප්‍රේතවස්තුව එක්තරා සූකරමුඛ ප්‍රේතයෙකු අරබයා වදාළ සේක.

යටගිය දවස කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පැවදි වූ එක් භික්‍ෂු නමක් කායචාරයෙන් සංයම ඇත්තේ විය. වාක්චාරයෙන් සංවර නැත්තේ විය. භික්ෂූන්ට ආක්‍රොෂ කෙරෙයි පරිභව කෙරෙයි. ඒ භික්ෂුව පසුව කලුරිය කොට නිරයෙහි උපන්නේ බුද්ධෝත්පාද කාලයෙහි රජගහ නුවර සමීපයෙහි ගිජුකුළුපව්ව අසල ඒ කර්‍මයාගේම හෙවත් අසංවර වාග්චාරික අකුශල කර්‍මයාගේම විපාකාවශිෂ්ට වශයෙන් බඩසා දුකින් හා පිපාසයෙන් මඩනා ලද්දා වූ ප්‍රේතයෙක්ව උපනි. ඒ ප්‍රේත සත්වයාගේ ශරීරය ස්වර්ණවර්ණ විය. මුව හූරුමුව වැනි විය. එකල්හි ආයුෂ්මත් නාරද තෙරුන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ වසන සේක්. එක් දිනක් උදෑසනින්ම සිරුර පිළිදගුම් කොට පා සිවුරු රැගෙන රජගහ නුවරට පිඬු පිණිස වඩිමින් අතර මගදී එකී ප්‍රේතයා දැක ඔහු විසින් කරන ලද කර්මය මෙසේ විචාළෝය.

එම්බල ප්‍රේතය, තාගේ ශරීරය සියල්ල රන් හා සමානය. ශරීරාලෝකයෙන් සියලුම දිශාවන් හාත්පසින් බබුළුවයි එසේද වුවත් තාගේ මුඛය හූරුමුව සමානය, මෙසේ වීමට තෝ පෙර අතීත ජාතියෙහි දී කෙබඳු වූ කර්‍මයක් කෙළෙහිදැයි විචාළෝය. මෙසේ තෙරුන් වහන්සේ විසින් ඒ ප්‍රේතයා යටගිය දවස කළ කර්‍මය පවසන්නේ,

ස්වාමීනි නාරදයන් වහන්ස. මම පෙර කායචාරය පිළිබඳ හික්මීමෙන් යුක්තවීම වාක්චාරය සම්බන්ධී අසංවරයෙන් සමන්විතවීමි, ඒ කාරණයෙන් හෙවත් හික්මීම සහ නොහික්මීම යන ඒ දෙකින් යුක්ත වූ මාගේ සිවිය හා ශරීර සණ්ඨානය යම් සේ නුඹ වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් දුටුවාහු ද එබඳු වී යයි නොහොත් කයින් මනුෂ්‍ය සටහන් ඇතිව ස්වර්ණවර්ණ වීමි. මුඛයෙන් සූකර සදෘශයෙක් වීමියි කීයේය. මෙසේ තෙරුන් වහන්සේ විචාරනු ලැබූ ප්‍රේත තෙම ඒ කරුණ විසඳා ඔහුම නිමිත්තකොට තෙරුන් වහන්සේට අවවාද දෙමින් මේ ගාථාව මෙසේ කීය.

ස්වාමීනි නාරද තෙරුන් වහන්ස, යම්හෙයකින් ගෙළ පටන් යට කොටස මිනිස් සටහන් වුවද මතු හූරු සටහන් වූ ද මේ මාගේ ශරීරය නුඹ වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ හෙයින්ම දක්නා ලද්දේද එහෙයින් ඔබ වහන්සේට මම අවවාද වශයෙන් කියමි, වචනයෙන් මුසාවාදාදී පාප කර්මකොට මාසේ සූකර මුඛ ඇත්තෙක් නොවෙනු මැනවි. ඉදින් වනාහි නුඹ වහන්සේ දොඩමලුව වචනයෙන් පව් කරන්නාහු නම් ඒකාන්තයෙන් සූකර මුඛ ඇති වන්නාහුය.

ඉක්බිති ආයුෂ්මත් නාරද තෙරුන් වහන්සේ රජගහ නුවර පිඬු පිණිස හැසිර බතින් පසු වේලෙහි පිණ්ඩපාතයෙන් පෙරළා වැඩියේ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා සංඛ්‍යාත සිව්පිරිස වූ බුදුරජාණන් වහන්සේ "නාරදය මා විසින් ඒ ප්‍රේත සත්වතෙම පෙරදීම දක්නා ලද්දේ යයි වදාරා නොයෙක් අයුරින් ලාමක වූ වාග්දුශ්චරිත සන්නිශ්‍රිත වූ ආදීනවය හා වාග්සුචරිත ප්‍රතිසංයුක්ත වූ ආනිසංසයත් වදාරමින් ධර්ම දේශනා කළසේක. ඒ දේශනාව එතැන්හි පැමිණි පිරිසට සාර්ථක විය.

අනුන්ට බැණ වැදීම් අපහාස කිරීම් ආදී වාග් දුශ්චරිතයේ යෙදීමෙන් සිදුවන විපාක දක්වෙන බුද්ධ දේශනාවකි.



## නිරන්තරයෙන් ආජීවඅට්ඨමක සීලය සමාදන් වෙමු.

01. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
02. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
03. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි
04. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
05. පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
06. පරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාදියාමි
07. සම්ප්‍රප්පලාපා වේරමණී සික්ඛාපදං සමාදියාමි
08. මිච්ඡාජීව වේරමණී සික්ඛාපදං සමාදියාමි

## පසිඳුරන් අනියතය

*තුටු උනෙමි දකිමින් නෙක රූප*
*තුටු උනෙමි අසමින් නෙක ශබ්ද*
*සොය සොයා ගියෙමි මම දිවට රස ලැබදෙන්න*
*පැහැබර වූ කය නිතර වින්දේය නෙක පහස*
*ඇලුනෙමි ආශාවෙන්.. ...*
*ගැටුනෙමි ද්වේශයෙන්.. ..*
*අසිරුය, පැටලිලිය වර්ගීකරණය කිරීමට*
*දෝරගලා එන සිතුවිලි.. .. ..*
*දරදඬුය, නොපහන්ය තුන් කල්හි දිවෙන සිත,*
*ගෙවුනි කාලය මෙලෙසට*
*වැකුණි අම බුදු වදන් සවනතට*
*වැටහුණි පසිඳුරන් අනියතය*
*වටහාගත්තෙමි සසර දුක*
*දොරගුළු දමමි නොඑන්නට*
*නොනිස් සිතුවිලිවලට*
*වඩමි බවුන් විදර්ශනාවට*
*පිය නගමි ගමන් මග අරි අටඟි*
*ගනිමි වීර්යය*
*නවතාලන්නට සසර දුක*

*රේණුකා කුමුදිනි විදානාරච්චි*
*12-2355*

# "නමෝ තස්ස භගවතෝ"

## නමස්කාර පාඨයේ ඉතිහාසය

මේ උතුම් නමස්කාර පාඨය අප බෞද්ධයින් විසින් යන්තමින් බහ තේරෙන වයසේ පටන්ම දිනකට වරක්වත් තම මුවින් බුදුන් වහන්සේ උදෙසා පිටකරන අතර මේ පාඨයේ ඉතිහාසය කුමක්දැයි නොදන්නවා විය හැක.

කවරෙකු කුමන කෙනෙක් උදෙසා කවරදා කොතැනදී කියන ලද්දක්දැයි යන්න ශ්‍රද්ධා සම්පන්න බෞද්ධයින්ගේ අවධානය පිණිස යොමු කරනු කැමැත්තෙමි.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ සකල කෙලෙසුන් දුරු කොට බුද්ධරාජ්‍යයට පැමිණි දෙවනදා උන්වහන්සේට තුතිමල් පුදා නමස්කාර කිරීම පිණිස කරන ලද පාඨයකි මේ. සකල කෙලෙසුන් දුරුකල මහබෝ මැඩදී සාතාගිරි නම් යක්ෂයා විසින්ද, රාහු අසුරේන්ද්‍රයා විසින්ද, සතරවරම් දෙව් රජවරු විසින්ද, ශ්‍රක්‍රදේවේන්ද්‍රයන් විසින්ද, මහා බ්‍රහ්මයන් විසින්ද, සර්වඥයන් වහන්සේට නමස්කාර පූජා කරන ලදී.

මේ නමස්කාර පාඨයෙහි අටලෝ අක්ෂරයෙන් මුලින්ම දැක්වෙන 'න' කාරකය සත්වයන් නරකයට යාම වලක්වා නිවන්පුරයට පමුනුවන බැවින්ද, දෙවෙනි 'මෝ' යන්න තුන්ලෝ සතුන් මොක්ෂ පුරයට ප්‍රවේශකොට දිගුකලක් සැපගෙන දෙන හෙයින්ද, පළමුවෙන් සතාගිරි යක්ෂයා 'නමෝ' යන පදය ගලපා සර්වඥයන් වහන්සේට වැඳ නමස්කාර කළේය.

දෙවනුව දීපංකර පාද මුලයෙහි පටන් බෝමැඩ දක්වා තෘෂ්ණාදියෙන් තොරව, අසත්‍ය වශයෙන් බැහැරව ලෝක සත්වයාට අර්ථයෙන්, ධර්මයෙන්, ප්‍රියතෙපුල් වදාළ හෙයින් ද, බුදුරජුන්ට 'තස්ස' යන වචනයෙන් නමස්කාර වේවායි රාහු අසුරේන්ද්‍රයෝ වැන්දේය.

තුන්වනුව තමන් වහන්සේගේ නුවණින් සණරාමර ලෝක සත්වයාට අග්‍ර දක්ෂිණෙය්‍යය වන බැවින්ද, දාන ශීලාදියෙන් ක්ලේශයන් නග්නකොට සම්‍යක්සම්බෝධිප්‍රාප්ත වූ බැවින්ද, සතරවරම් රජ දරුවෝ 'භගවතෝ' යන අක්ෂර කියා නමස්කාර කළහ.

සතර වෙනුව භව චක්‍රයේ ගමන් කිරීමට හේතු වූ අවිද්‍යා තෘෂ්ණාදී කෙලෙසුන් බෝමැඩදී ප්‍රඥා නැමැති කඩුවෙන් සිඳ ලොව්තුරා බුද්ධත්වයට පැමිණි සුවාසු දහසක් ධර්මයන් දේශනා කොට බුද්ධාන්තරයක් මුළුල්ලේ අගුළු වැටී තිබුණු නිවන්පුර දොරහැර සත්වයා නිවන් පුරයට ප්‍රවේශ කළ බැවින්ද, අනන්ත අප්‍රමාණ ගුණ කඳෙන් සපිරි බැවින්ද, ශක්‍රදේවේන්ද්‍ර තෙම 'අරහතො' යන අකුරු සතර ගලපා භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කළේය.

පස්වෙනුව තමන්වහන්සේ විසින්ම දුක්ඛ සත්‍ය, සමුදය සත්‍යය, නිරෝධ සත්‍යය, මාර්ග සත්‍යය යන චතුර් සත්‍යය ජානනය කළ බැවින්ද, සහම්පති නම් මහා බ්‍රාහ්මයා 'සම්මා සම්බුද්ධ' යන නාමයෙන් සර්වඥයන් වහන්සේට අභිවාදනය කරනු ලැබුවේය.

බුද්ධෝත්පාද කාලයේ පටන්ම මේ නමස්කාර පාඨය ලෝක පූජිත වී සකල ලෝක වාසී බෞද්ධ ජනතාවගේ අපිරිමිත භක්තියට හා ගෞරවයට පාත්‍ර වී තිලෝගුරු බුදුපියාණන් වහන්සේට වැඳ නමස්කාර කරන්නේය.

*පොතපත ඇසුරෙන් සකසන ලද්දකි.*

# රහත්වූවේද පිරිනිවෙන තුරු කුස පිරෙන්න ආහාරයක් නොලද ලෝසක හිමි

සිඟමනින් ජීවත් වූ කුඩා දරුවෙක් සැරියුත් ස්වාමීන් වහන්සේ කරුණාවෙන් පැවිදි කළා. මොහු නමින් ලෝසක හිමිය. ඒ හිමිට කිසි දිනක කුස පිරෙන්න ආහාරයක් ලැබුණේ නැත. ඒ හිමියන් සමඟ වැඩියොත් සැරියුත් හිමියන්ට වත් දානය ලැබෙන්නේ නැත. එතරම්ම අවාසනාවන්ත වුනත් පෙර පිරූ පාරමී තිබුණා. ඒ පින් බලයෙන් රහත් විය. නමුත් දානය බෙදන්න මිනිසුන් ගෙනෙන විට පාත්‍රය පිරී දානය තියෙනවා වාගේ පේනවා. දානය බෙදුවේද ඒවා වියලී යන්නේය. ජීවත් වීමට පමණක් ස්වල්පයක් ඉතිරි වෙනවා. පිරිනිවන් පානතුරු කුස පිරෙන්න ආහාරයක් නොලැබුණේය. මෙය දැනගත්විට සැරියුත් හිමියෝ පිරිනිවන දිනයේ ප්‍රනීත දානයක් භික්ෂුවක් අතේ එවන්නට යෙදුනා. දානය ගෙනා භික්ෂුව එය මගදී වළඳා එයද නොලැබුණි. මෙය දැනගත් සැරියුත් හිමියෝ සංවේග වී චතුමධුර පාත්‍රයක් ගෙන තම අතේ තියෙද්දීම ලෝසක හිමිට එය වළඳන්න දුන්නා. එදින තමයි මුළු ජීවිත කාලයේම කුස පිරෙන්න ආහාරයක් ගත් දිනය. මේ හිමියන්ගේ පූර්ව කර්මය බුදු නුවණින් දැක මෙසේ වදාළේය.

මේ ලෝසක හිමි කාශ්‍යප බුදු සසුනේ පැවිදිව හොඳින් සිල් ගුණ පුරමින් භාවනා කළේ ද ලාභාශාවෙන් මැඩි රහත් හිමි නමකගේ සිව්පස වලකාලූයේය. තම දායකයෝ එම රහත් හිමිට සිව්පසයෙන් සළකන විට කැමති නොවුනි. රහත් හිමිට දෙන්න යැයි දුන් කිරිබත් පාත්‍රය ද තරහා සිතින් ගිනි අඟුරෙහි ලා පුළුස්සා දැම්මේය. මේ දුෂිත කර්මයෙන් අපායෙහි ඉපිද අවුරුදු ලක්ෂ ගණනක් දුක් වින්දේය. ආත්ම පන්සියයක්ම පිළිවෙලින් යක්ෂයෙක් වී ඉපදුනා. ඒ ජාති පන්සියෙහිම බඩපුරා කෑයේ එකම දවසකය. කෑයේද ගැබ්මල ගොඩකි. එයින් පසු තවත් ආත්ම පන්සියයක්ම සුනඛව ඉපදුනා. ඒ ජාති පන්සියෙහිම බඩපුරා කෑයේ එකම දවසකය. එදාද කැයේ වමනය කළ බත් අසූචියකි. මනුලොවද ඉපිද බොහෝ දුක් විඳි අතර මේ අවසන් ආත්මයේදී ද පිළිසිඳගත් දින පටන් මුළු ප්‍රදේශයේම කටයුතු පිරිහී ගියේය. මිනිසුන් කාලකන්නියා කව්දැයි සොයා මේ මව ගමින් ද පන්නා දැම්ය. ඕ තොමෝ ඉන්නට තැනක්, කන්නට බතක්, බොන්නට දියක්, අඳින්නට වතක්, යන්නට මඟක්, නොවූයෙන් දුකින් දුකටම පත් වූවාය. පසුව මොහු ලොවට බිහිකොට පයින් ඇවිදින්න හැකි වෙනකල් කබලක් දී පාරේ අතහැර දැමීය. එදා සිට ඉඳුල් කා හැදුනේය. බලන්න සත්පුරුෂයෙනි, එක් දිනක රහත් හිමි නමකගේ ලාභයක් වැළැක්වූ පවින් බුද්ධාන්තරයක්ම දුක් දුන්නේය.

(ලෝසක ජාතකය ඇසුරෙණි)

### භික්ෂුන් වහන්සේලා විසින් ගිහි පිංවතුනට සෙත් පැතිම.

අභිවාදන සීලිස්ස
නිච්චං වද්ධාපචායිනො
චත්තාරෝ ධම්මා වඩ්ඩන්ති
ආයුවණ්ණෝ සුඛංබලං

ආයුරාරෝග්‍ය සම්පත්ති
සග්ග සම්පත්ථි මේවච
අථෝ නිබ්භාණ සම්පත්ති
ඉමිනාථේ සමිජ්ජතු

නිතර වැඳුම් කළයුතු ගුණවතුන් වඳින වැඩිහිටියන්ට ගරු සත්කාර කරන තැනැත්තාට ආයුෂ, වර්ණ, සැප, බල යන ධම් සතර වැඩෙති

ආයුස හා ආරෝග්‍යසම්පත්තිය ද සමගි සම්පත්තියද නිවන් සැපතද මේ පිනෙන් ඔබට සමුර්ධ වේවා.

### ගිහි පිංවතුන් විසින් ස්වාමීන් වහන්සේලාට සෙත් පාතා නමස්කාර කිරිම.

සීලවන්නං ගුණවන්තං
පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං,
දුල්ලභෙන මයා ලද්ධං
බුද්ධපුත්තං නමාමහං

සිල් වත්වු ද ගුණවත්වූ ද, අනුත්තර පිංකෙතක් බඳුවූද, මා විසින් දුර්ලභව ලබන ලද බුද්ධ පුත්‍රයන් වහන්සේට නමස්කාර කරමි.

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ..........................................................................

2. ස්ත්‍රී / පුරුෂ භාවය................ 3. ජාතික හැඳුනුම්පත් අංකය..........................................
(ඡායා පිටපතක් අමුණන්න)

4. උපන් දිනය...................... 5. වයස................. 6. ආගම..........................................

7. ස්ථිර ලිපිනය..........................................................................

..........................විද්‍යුත් තැපැල(e-mail)............................ දුරකථන අංකය..............................

8. දිස්ත්‍රික්කය..................... 9. විවාහක / අවිවාහක බව..........................................

10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර..........................................................

..........................................................................

11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..........................................................

12. ලිපි එවිය යුතු ලිපිනය..........................................................................

13. ලබා ඇති ඉහළම අධ්‍යාපනික සුදුසුකම්
1..........................................................................
2..........................................................................

14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර
1 ..........................................................................
2 ..........................................................................
3 ..........................................................................

15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර
..........................................................................

16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.

17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර . .
..........................................................................

18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදී වැදගත්යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි
සඳහන් කරන්න ..........................................................................
..........................................................................

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය...................... අයදුම්කරුගේ අත්සන..................................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය..................................

..................................
තේරීම් කමිටු සභාපති

..................................
විධායක ලේකම්

දිනය.................

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැඳුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු,කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය තම ආදායම් තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිත ග්‍රම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුද, අගහරුවාද හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාද, ඉරිද ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සෑමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනිමට හේතුව දැනගැනිමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායාපිටපතක් සහ 4"x 9" ප්‍රමාණයෙන් යුතුව තම ලිපිනය ලියූ මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න.
(අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)
ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථනය 011-2505088 0714-014467

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

## වැදගත්

❖ මෙත් සවිය පුවත් සගරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සගරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සගරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබඳව වග කියනු නොලැබේ.

- සංස්කාරක -

## මෙත්සවිය දුරකථන අංක

මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා අමතන්න (0112505088 හෝ 0714-014467). අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මිට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ 0777-710765 හා බී. ඩබ්. චමින්ද 0777390906 යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතිම දුරකථන අංක 0714 800800 හෝ 0777 309385 මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවී


### කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අභංගම ආනන්ද මහා සව්විරයන් ගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් එම ද්‍රව්‍ය ගරු ස්වාමීන්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාරදෙන්න.

### ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 13 වන වැඩසටහන

2008.08.31 දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2008.08.17 දිනට පෙර භාර ගනු ලැබේ.

ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ

### නොමිලයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. රෝද පු හෝ කිහිලි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කල යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිළි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

### සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

**SIGHT-N~ STYLE OPTOMETRISTS**

නො: 126ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
දුරකථනः 2854758)
(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)
මෙ.ස.සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය

**For Advertising, Web Designing, Priniting Services**

වෙළඳ ප්‍රචාරන සේවා, අන්තර්ජාල වෙබ්අඩවි නිර්මාණ, සහ මුද්‍රණ සේවා

*Visual Craft*

No.106/3 Main Rd, Attidiya, Dehiwala,
Tel: 4203478, 0777 801252

### SOUTHERN SMART (PVT) LTD.

**ස්මාට් කිංසයිස් මදුරු දැල්**

පාරිභෝගික අවශ්‍යතා අනුව පර්යේෂණාත්මකව වැඩිදියුණු කල ස්මාට් කිංසයිස් මදුරු දැල් ඉහල ප්‍රමිතියෙන් හා කල් පැවැත්මෙන් උසස් තත්වයක පවතින බව අත්හදාබැලීම් වලින් සනාථ කර ඇත.
සංචාරක හෝටල්, නේවාසිකාගාර, රෝහල් වැනි ආයතන සඳහා විශේෂ ඇණවුම් සඳහා විමසන්න.


අභිමානවත් දේශීය නිෂ්පාදනයකි.

P.O. Box 37, Kadawatha, Sri Lanka.
Tel: (94) 60-2197515, 0777 354331, Fax: (94) 11 4814302
E-mail: info@smartlk.com, smartmnet@dialogsl.net
Web: www.smartlk.com


කොල්ලුපිටිය ප්‍රදේශයේ දහම් පාසලකට ස්වේච්ඡාවෙන් ඉගැන්වීමට කැමති ගුරුවරුන් අවශ්‍යව ඇත. මේ සඳහා ඉදිරිපත්වීමට කැමති අයට 'මෙත්සවිය' පරිපාලන නිලධාරී මහතාගෙන් හෝ සමලේකම් තුසිත දොඹගොඩ මහතාගෙන් (0777-710765) විස්තර ලබාගත හැක


# පිංපොතෙන් බිඳක් ........





සැම වසරකම ජනවාරි පළමුවන දින හුනුපිටිය ගංගාරාමයේදී පවත්වනු ලබන සාංඝික දානය සහ කේස ධාතු වන්දනාව.





නොමිලයේ ඇස් පරීක්ෂා කිරීම සහ ඇස් කන්නාඩි ලබාදීමේ කඳවුර.






රෝද පුටු පරිත්‍යාගය





පූජ්‍යපාද විමල හිමියන්ට පරිගනකයක් පූජා කිරීම.

ජයන්ති ළමා නිවාසයේ සිටින අසරණ ළමුන්ට ආහාර ඇතුළු අවශ්‍ය කළමණා පරිත්‍යාගය.






සිරකරගෙන සිටි නාගයන් නිදහස් කිරීම.


මෙත්සවියට පරිගනකයක් සහ පොත් අල්මාරියක් පරිත්‍යාග කිරීම.

## දාන සීල භාවනා වැඩ සටහන 2008-03-02 - ඉංගිරිය මඩකඩ ආරණ්‍යය සේනාසනයේදී





මස් මඩුවේදී පුජ්‍යපාද අහංගම ආනනඳ හිමියහගෙන් අභය දනය ඉල්ලා වැදවැටීම.



මහා මාර්ගයට ගවයන් මුදහැරීමද ප්‍රබල සත්ව හිංසනයකි



වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ ප්‍රතිසංස්කරනය කිරීමට බලාපොරොත්තුවන ඍර්භිත ධර්ම ශාලාව. අට මහා කුසල කර්මයන්ගෙන් එකක් වන විහාර තැනීමේ මහා කුසල කර්මයට ශාසනලැදි පිංවත් ඔබටත් හැකි ශක්ති ප්‍රමාණයෙන් සම්මාදම් විය හැක.